පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 260

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නවවැනි පාර්ලිමේන්තුව
(තෙවැනි සැසිවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

(ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාළව
2019 හා 2020 මූල්‍ය වර්ෂවල
විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන්
2022.12.08 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී
සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන්
ඉදිරිපත් කරනු ලබන විශේෂ වාර්තාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා විසින්

2023 ජනවාරි මස 20වන දින ඉදිරිපත් කරන ලදී

2023 ජනවාරි මස 20වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

නවවැනි පාර්ලිමේන්තුව (තෙවැනි සැසි වාරය)

2022 ඔක්තෝබර් මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන සහ 2022 අගෝස්තු මස 29 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසි වාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 30දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, පා.ම.,
2. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.,
3. ගරු ජානක වක්කුඹුර මහතා, පා.ම.,
4. ගරු ලොහාන් රත්වත්තේ මහතා, පා.ම.,
5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.,
6. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.,
7. ගරු ශාන්ත බණ්ඩාර මහතා, පා.ම.,
8. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
9. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා, පා.ම.,
10. ගරු පාඨලී චම්පික රණවක මහතා, පා.ම.,
11. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
12. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
13. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.,
14. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.,
15. ගරු නිමල් ලාන්සා මහතා, පා.ම.,
16. ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා, පා.ම.,
17. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
18. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.,
19. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,
20. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.,
21. ගරු සංජීව එදිරිමාන්න මහතා, පා.ම.,
22. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා, පා.ම.,
23. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා, පා.ම.,
24. ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, පා.ම.,
25. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම.,
26. ගරු එම්. රාමේෂ්වරන් මහතා, පා.ම.,
27. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.,
28. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය, පා.ම.,
29. ගරු නීතිඥ මධුර විතානගේ මහතා, පා.ම.,
30. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම.,

කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - නිශාන්ති එස්. වික්‍රමරත්න මිය
- ප්‍රධාන නිලධාරී - සී. එම්. සුබසිංහ මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ඒ. එම්. ෂහීඩ් මයා
- සහකාර ප්‍රධාන නිලධාරී - ජී. ආර්. යූ. ගමගේ මිය
- සහකාර ප්‍රධාන නිලධාරී - ඩබ්ලිව්. එල්. එස්. ඩී. ද අල්විස් මිය
- සහකාර ප්‍රධාන නිලධාරී - යූ. එස්. ප්‍රභාෂිනී මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ආර්. සී. කුලතිලක මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී.එම්. එච්. එස්. ගම්ලත් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මෙය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය

කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බා ගත කළ හැක.

www.parliament.lk ⟶ සිංහල ⟶ ප්‍රකාශන ⟶ කාරක සභා වාර්තා

<u>පටුන</u>

පිටු අංක

1. සභාපතිතුමාගේ සටහන v

2. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරයේ දෙවැනි වාර්තාව vii

3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය 01

4. පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ශනයට ලක් කරනු ලැබූ ආයතන - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 03

5.ඇමුණුම් 23

6. වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය/ (අලාභය) හෝ අතිරික්තය/ (ඌණතාවය) 39

<u>සභාපතිතුමාගේ සටහන</u>

ශ්‍රී ලංකාවේ සමස්ථ අපනයන ආදායමට සාපේක්ෂව ඉන් 70%ක පමණ වාර්ෂික ආදායමක් ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රය විසින් ජනිත කරවන බැවින් විදේශ රැකියා ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාළව 2019 සහ 2020 මූල්‍ය වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එම ආයතනයෙහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරනු ලැබූ කරුණු මෙම වාර්තාවෙහි අඩංගු වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආයතනික ව්‍යුහය සහ එහි කාර්යභාරය, විගමනික ශ්‍රම සැපයුමේ වර්තමාන තත්ත්වය, විදේශ රැකියා ක්ෂේත්‍රයේ පවතින ගැටළු, සීමාවන් සහ ඌනතාවයන් මෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳ පොළ තත්ත්වය පිළිබඳවත්, මෙම ගැටළු සහ අඩුපාඩු හඳුනා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත්, පසුගිය කාලපරිච්ඡේදය තුළ විදේශ රැකියා ඇණවුම්වල බිඳවැටීම් පිළිබඳවත් 2022 දෙසැම්බර් මස 08 වන දින රැස් වූ කාරක සභාවේ දී සාකච්ඡා කරනු ලැබූ අතර එහිදී එම කරුණු සම්බන්ධව විගණකාධිපති විසින් යොමු කරනු ලැබූ විශේෂ අවධානය මෙහිදී අගය කළ යුතු වේ.

ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් එහි ආයතනික අරමුණු කෙරෙහි වැඩි අවධානක් යොමු කර ලංකාවේ ඉදිරි වසරවල අපේක්ෂිත විදේශ ප්‍රේෂණ ප්‍රමාණය සපුරා ගැනීමට කටයුතු කිරීමටත්, ගිණුම්කරණ කටයුතු සම්බන්ධව නිසි ක්‍රමවේදයන් අනුගමනය කිරීමටත් සහ විගණන වාර්තාවල දක්වා ඇති ගිණුම්කරණ සහ කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමටත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බව මෙහිදී අවධාරණය කෙරේ.

මෙම විමර්ශන කටයුතු සඳහා දායක වූ කාරක සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, මෙම විශේෂ විගණන වාර්තාව සකස් කොට, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති සහ ඔහුගේ කාර්ය මණ්ඩලය ඉටු කරන සේවාව වෙනුවෙන් මාගේ ගෞරවණීය ස්තූතිය පිරිනමමි. එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාලයේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත්, මෙම වාර්තාව පරිවර්තනය කිරීමේ කටයුතුවලට සහයෝගය දැක්වූ පරිවර්තන අංශයේ සැමටත් මාගේ ගෞරවණීය ස්තූතිය පිරිනැමේ.

මහාචාර්ය රංජිත් බණ්ඩාර,
සභාපති,
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරයේ දෙවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ද, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට අදාළව 2019 හා 2020 මූල්‍ය වර්ෂවල විගණකාධිපති වාර්තාවල සඳහන් කරුණු පිළිබඳව සහ කාර්යංශයේ වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන් 2022.12.08 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විශේෂ විමර්ශනයට ලක් වූ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2019, 2020 සහ 2021 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය පහතින් දක්වා ඇත.

1. **තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)**
   විගණකාධිපතිට ආයතනයේ ගිණුම් තුළ සැලකිය යුතු උල්ලංඝනය කිරීම් හෝ අවප්‍රකාශයන් හඳුනාගැනීමට නොහැකි බව.

2. **තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)**
   ආයතනය ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා නොවීම හෝ ඒවා තහවුරු කිරීමට ලේඛනගත සාක්ෂි හඳුනාගැනීමට නොහැකි බව.

3. **මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)**
   ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

4. **අහිතකර මතය (Adverse Opinion)**
   සාවද්‍ය හෝ විශ්වාස කළ නොහැකි තොරතුරු නිසා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ සැලකිය යුතු ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් හමු වූ බව.

	ආයතනය	විගණන මතය		
		2019	2020	2021
01	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

(කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය)

විමර්ශනය කරන ලද දිනය: 2022.12.08

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව පහත සඳහන් කරුණු විගණකාධිපති විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

- පනතේ 5 (1) (ඇ) වගන්තිය අනුව, අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුතු සාමාජිකයින් 08 දෙනෙකුගෙන් 04දෙනෙකු බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල නියෝජිතයන් විය යුතු වීම තුළින් ලබැඳියාවන්ගේ ගැටුමක් (conflict of interest) නිර්මාණය වන බව,
- පනත අනුව, මෙම ආයතනයේ කාර්යයන් සම්බන්ධව විදේශ රැකියා කර්මාන්තය නියාමනය සහ ඊට අවශ්‍ය සහාය ලබාදීම යන කරුණු සම්බන්ධයෙන් අපැහැදිලිතාවයක් පවතින බව,
- නියාමනයට ලක්වන ආයතන නියාමනය කිරීම සඳහා එම ආයතනවල නියෝජිතයින්ම පත් කිරීම තුළ ගැටුමක් ඇති වන බව,
- පනත අනුව අමාත්‍යවරයාට පත්කිරීම් කළ හැක්කේ අධ්‍යක්ෂ මණ්ඩල තනතුරුවලට පමණක් බව,
- පනත අනුව 'උපසභාපති' නමින් ආයතනගත තනතුරක් නොමැති නමුත් අමාත්‍යවරයා විසින් 2022.07.26 දින එම තනතුරට පුද්ගලයෙකු පත් කර ඇති බව,
- මෙම උපසභාපති තනතුරට පත්කිරීම නීත්‍යානුකූල නොවන බවට අවස්ථා කීපයක දී ම නීතිපති විසින් ද අදහස් දැක්වීමක් සිදු කර ඇති බව,
- ආයතනගත නොවන තනතුරකින් ගන්නා ලද තීරණවල වලංගුතාවය සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයක් යම් අවස්ථාවක දී උද්ගත විය හැකි බව, සහ
- පනතට අනුව යම් කිසි නිශ්චිත කාලසීමාවකට යටත්ව යම් යම් සුවිශේෂී වගකීම් පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි පවරා දිය හැකි බව.

එසේම මේ සම්බන්ධව විගණකාධිපතිගේ මතය වූයේ, ස්ථිර සාමාන්‍යාධිකාරීවරයෙකු සිටියදී, ආයතනගත වෙනත් ස්ථිර තනතුරක් සඳහා, නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව පරිපාලන බලතල පැවරීම තුළ ආයතනයේ අභ්‍යන්තර කටයුතුවලට එමඟින් බාධාවක් ඇති විය හැකි බවයි.

මෙවැනි පත්කිරීමක් සම්බන්ධව අමාත්‍යාංශය විසින් කිසිඳු නිර්දේශයක් සිදු කර නොමැති බව අමාත්‍යාංශ අතිරේක ලේකම් (පාලන) විසින් මෙහිදී සඳහන් කරන ලදී.

මෙහිදී අමාත්‍යාංශ ලේකම් විසින් පැහැදිලි කරන ලද්දේ;

- උක්ත සඳහන් කරන ලද පනතේ ඇති ගැටලුකාරී සහ අපැහැදිලි කරුණු සංශෝධනය කිරීම සඳහා මේ වන විට අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස් කර කටයුතු කරමින් පවතින බව,

- පනත සංශෝධනය කිරීමේ කටයුතු දැනට එහි අවසන් අදියරේ පසු වන බව,
- නව පනත අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුළත් විය යුතු බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල නියෝජිතයන්ගේ ගණන 02ක් ලෙසට සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ අනුව මෙහිදී ඇති විය හැකි ලබැදියාවන්ගේ ගැටුම අවම කර ගැනීමට කටයුතු කරන බවත්, සහ
- නව පනත අනුව, අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරට සමාන මට්ටමේ නිලධාරියෙක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව යි.

නමුත්, මේ පිළිබඳව අදහස් දැක්වූ විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලද්දේ ඉහත සඳහන් කරනු ලැබූ නව තත්ත්වයන් යටතේ වුවද ලබැදියාවන්ගේ ගැටුම එලෙසම පවතින බවයි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. පහත සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් රේඛීය අමාත්‍යතුමා දැනුවත් කිරීම.
    - 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව 'උපසභාපති' නමින් ආයතනගත නොවන තනතුරකට අමාත්‍යතුමා විසින් පත්කිරීමක් සිදු කිරීම.
    - මෙම උපසභාපති තනතුරට පුද්ගලයෙකු පත්කිරීම සම්බන්ධව නීතිපතිගේ මතය.

ii. උපසභාපතිගේ ධුර කාලය තුළදී මේ දක්වා ඔහු විසින් ගනු ලැබූ සියලු තීරණ සහ ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ මතය, කාරක සභාවටද පිටපතක් සහිතව සති දෙකක් ඇතුළත ආයතනයේ සභාපති වෙත දැනුම් දීම.

iii. එම උපසභාපති විසින් ගනු ලැබූ සියලු තීරණ, නීතිවිරෝධී තීරණ ලෙස කාරක සභාව විසින් පිළිගැනීම.

iv. වර්තමාන පනතේ දක්නට ලැබෙන අපැහැදිලි සහ ගැටලුකාරී අවස්ථා අවබෝධ කර ගනිමින් එම තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට නොපමාව කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MFE/FIN/08/12/1 (Vol. IV) හා 2023.01.10 දිනැති ලිපිය මඟින් මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය, අමාත්‍යාංශ ලේකම් විසින් පහත පරිදි වාර්තා කර ඇත.

i. කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශයන්හි සාරාංශය 2022.12.19වන දින ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කර ඇති බව.

ii. කාර්යංශයට අදාළ සියලුම අවසන් පරිපාලන තීරණ ගෙන ඇත්තේ කාර්යාංශයේ සභාපති විසින් වන බව.

iii. එවකට කාර්යාංශයේ උපසභාපති වූ ඒ.ඒ.එම්.හිල්මි මහතා, කාර්යාංශයේ උපසභාපති ලෙස පත් වූ දින සිට 2023.01.08 වන දින දක්වා කාලය තුළ ඔහු විසින් කිසිඳු පරිපාලන තීරණයක් ලබා දී නොමැති බව.

iv. ඒ.ඒ.එම්.හිල්මි මහතා, 2023.01.09 වන දින සිට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සභාපති වශයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් පත් කර ඇති බව.

v. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර ඇති අතර සංශෝධිත පනත කඩිනමින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.

02. **<u>කම්කරු සුභසාධන අරමුදල</u>**

- 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 17 වන වගන්තිය අනුව, "කාර්යාංශයේ අරමුදල" නමින් අරමුදලක් පවත්වාගෙන යා යුතු බව,
- එම අරමුදලට ගෙවනු ලැබිය යුතු සහ එම අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු මුදල් පිළිබඳව එම වගන්තියෙහි අර්ථ දක්වා ඇති බව,
- 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 45 වන වගන්තිය අනුව, "කම්කරුවන්ගේ සුභසාධන අරමුදල" නමින් වෙනත් අරමුදලක් පවත්වාගෙන යා යුතු බව සඳහන් වන නමුත්,
- ආයතනය විසින් මෙම අරමුදල සඳහා වෙනමම ගිණුමක් පවත්වාගෙන යාම සිදු නොකරන බව, කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. කාර්යාංශයේ ගිණුම් සහ කම්කරු සුභසාධන අරමුදලෙහි ගිණුම් වෙන වෙනම පවත්වාගෙන යාමට කටයුතු කිරීම සහ වෙන වෙනම ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

ii. කාර්යාංශයේ මුදල් සහ අරමුදලේ මුදල් පොදුවේ භාවිතා කිරීම වළක්වමින්, පනතේ සඳහන් නිශ්චිත කරුණු සඳහා පමණක් කම්කරු සුභසාධන අරමුදලින් ගෙවීමට කටයුතු කිරීම.

iii. 2022 වර්ෂයේ සිට මෙම තත්ත්වය නිරාකරණය කර ගිණුම් තැබීම නිසි පරිදි සිදු කිරීමට කටයුතු කිරීම.

iv. කම්කරු සුභසාධන අරමුදල සම්බන්ධව විගණකාධිපතිගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

පනතේ සඳහන් නිශ්චිත කරුණු සඳහා පමණක් කම්කරු සුභසාධන අරමුදලින් වියදම් දැරීමට කටයුතු කරන බවත්, 2021 වර්ෂය දක්වා කාර්යාංශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම්කරණ සටහන් යටතේ කම්කරු සුභසාධන අරමුදල සඳහා වෙන් වූ තීරුවක් වෙන් කර ඇති නමුත් ශේෂ පත්‍රය ඒකාබද්ධව සකස් කර ඇති අතර 2022 වර්ෂයේ සිට ශේෂ

පත්‍රයේ ද වෙන් වූ තීරුවක් මඟින් කම්කරු සුභසාධන අරමුදල සඳහා වෙන් වූ තීරුවක් මඟින් ගිණුම්කරණ සටහන් දැක්වීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම්ගේ අංක අංක MFE/FIN/08/12/1 (Vol. IV) හා 2023.01.10 දිනැති ලිපිය මඟින් කාරක සභාව වෙත දන්වා ඇත.

03. **<u>මැද පෙරදිග සේවය කරන ශ්‍රමිකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද රක්ෂණ ක්‍රමය</u>**

කාර්යාංශය විසින් කුවේට් හි රක්ෂණ සමාගමක් වන ගල්ෆ් රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ආයතනය (gulf insurance & re insurance) සමඟ ගිවිසුමකට එළඹීම සම්බන්ධව කාරක සභාව විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- කුවේට් සේවයේ නිරත වූවන් සඳහා රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමට කටයුතු කිරීම.
- නමුත්, ඩොලර් 90 සහ ඩොලර් 100 ලංසු පිළිබඳව නොසලකමින් ඩොලර් 200ක් වැනි අධික මිලකට තමාට අවශ්‍ය වෙනත් ආයතනයකට එම ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් රක්ෂණය පිරිනමන බව අමාත්‍ය මණ්ඩලය වෙතට කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කළද සත්‍ය වශයෙන්ම සිදුවන්නේ, ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් කිසිදු ප්‍රසම්පාදනයකින් තොරව ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් තෝරාගන්නා ලද නියෝජිතයාට මෙම ගනුදෙනුව භාරදීමට කටයුතු කිරීම සහ
- එම නිසා රුපියල් බිලියන 07ක මූල්‍ය වංචාවක් සිදුවී තිබීම.

මෙම කරුණ සම්බන්ධව මේ වන විට විවෘත ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතින අතර ඒ සඳහා නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කරමින් පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් පවසන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. කාර්යාංශය විසින් කුවේට් හි රක්ෂණ සමාගමක් වන ගල්ෆ් රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ආයතනය සමඟ ගිවිසුමකට එළඹීම සම්බන්ධව සහ එම නිසා සිදු වී ඇති පාඩුව පිළිබඳව විස්තර ඇතුළත් විශේෂ විගණන වාර්තාවක් මාසයක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

ii. කාර්යාංශය විසින් කුවේට් හි රක්ෂණ සමාගමක් වන ගල්ෆ් රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ආයතනය සමඟ ගිවිසුමකට එළඹීම සම්බන්ධව අමාත්‍යාංශය විසින් ස්වාධීන අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර මාසයක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

විගණකාධිපති

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙම කරුණ සම්බන්ධව අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මඟින්, අභ්‍යන්තර විගණනයක් සිදු කර 2023.01.31 දිනට පෙර අදාළ වාර්තාව කාරක සභාවට ඉදිරිපත්

කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රගතිය වාර්තා කරමින් සඳහන් කර ඇත.

04. <u>ඊශ්‍රායල රජය සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව සාත්තු සේවකයින් සඳහා රැකියා අවස්ථා</u>

මෙම කරුණ පිළිබඳව කාරක සභාවේ අවධානයට යොමු වූ කරුණු පහත පරිදි වේ.

- ඊශ්‍රායල රජය සමඟ ශ්‍රී ලංකා රජය ඇති කර ගත් ගිවිසුමකට අනුව 2022 වර්ෂයේ සාත්තු සේවකයින් සඳහා රැකියා අවස්ථා 500ක් ලැබී තිබුණු අතර, 2022.12.01 දින වන විට ඒ සඳහා යොමු කර ඇත්තේ 203ක් පමණක් වීම.
- මුදල් අය කර ගැනීමෙන් පසුව පුද්ගලයින් 5000දෙනෙකුට ප්‍රායෝගික පුහුණුවක් ලබා දී තිබීම.
- මෙමඟින් රු. මිලියන 84ක පමණ ආදායමක් කාර්යාංශයට ලැබී තිබීම.
- ශ්‍රී ලංකා රජය සමඟ ඇති කර ගත් මෙම ගිවිසුම නිසා පෞද්ගලික අංශයට මේ සඳහා මැදිහත්වීමට අවස්ථාව අහිමි වී ඇති බව ඊශ්‍රායල රජය විසින් ලිපියක් මඟින් දැනුම් දී තිබීම.
- ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමෙන් පසුව විදේශගත වීමට නොහැකිවීම නිසා එම පුද්ගලයින් විශාල අපහසුතාවයකට පත් වී තිබීම සහ විවිධ සූරා කෑම්වලට ලක්වීම.

මෙහිදී කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- 2020.02.24 දින ඊශ්‍රායල රජය සමඟ මෙම ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර ඇති බව,
- මෙහිදී සාත්තු සේවකයින් සඳහා රැකියා අවස්ථා 500ක් ලැබී තිබුණු බව,
- ගිවිසුම අනුව, 90%ක් කාන්තාවන් සහ 10%ක් පිරිමි විය යුතු බව,
- ඒ අතුරින් 209 දෙනෙකු මේ වන විට විදේශ ගත වී ඇති බව,
- මෙම ගිවිසුම් ලබා දීම සිදු කරනු ලබන්නේ එරට රැකියා නියෝජිතායතන මඟින් වන බව,
- මේ වනවිට ගිවිසුම් 280ක් පමණ ඇති කර ගැනීමට කටයුතු කර ඇති බව,
- වර්තමානයේ දී ඊශ්‍රායලය විසින් ගිවිසුම් ගත වීම් ප්‍රමාද කරවන තත්ත්වයක් තුළ මේ වන විට මෙම ක්‍රියාවලියේ මන්දගාමී ස්වරූපයක් පවතින බවට පෙන්නුම් කරන බව සහ
- සාත්තු සේවක පුහුණුව ලබා දී ඇත්තේ ඊශ්‍රායලය සඳහා පමණක් නොවන අතර එය වෙනත් රටවල් සඳහා ද අදාල කර ගන්නා නමුත් බහුතරයක් පිරිස මෙම පුහුණු පාඨමාලාව හදාරනු ලබන්නේ ඊශ්‍රායලය වෙත යාමේ අදහසින් බව.

මෙහිදී කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් සඳහන් කරන ලද්දේ,

- මෙම ගිවිසුම මුල්වරට අත්සන් කර ඇත්තේ වර්ෂ 2017දී පමණ බව,
- එවකට පෞද්ගලික අංශය මඟින් ඊශ්‍රාලයට පැමිණෙන සේවකයින්ගෙන් එම ආයතන අධික ලෙස මුදල් අය කර ගන්නා බවට ඊශ්‍රායල ශ්‍රේෂ්ඨාධිකරණයේ චෝදනාවක් ගොනු කර ඇති බව,

- ඒ අනුව ඊශ්‍රායල නීතිය අනුව පෞද්ගලික අංශයෙන් බැහැරට ගොස් රජයන් අතර මෙම ගනුදෙනුව සිදු කළ යුතු බවට තීරණය කරනු ලැබූ බව,
- මෙලෙස රජය විසින් පමණක් ඊශ්‍රායලයට සේවකයින් යොමු කරනු ලැබීමේ තීරණය ගනු ලැබුවේ ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතාවය අනුව නොව ඊශ්‍රායල රජයේ අවශ්‍යතාවයක් අනුව බව,
- මෙහිදී එක් කොන්දේසියක් වන්නේ 500ක පිරිසකට රැකියා අවස්ථා ලබා දීමට නම් 1500ක පමණ පිරිසක් ඉල්ලුම් කළ යුතු බව සහ
- එනම් අවශ්‍යතාවයට අනුව තුන් ගුණයක පමණ පිරිසක් ඉල්ලුම් කළ පසුව ලොතරැයි ක්‍රමයකට අනුව පිරිස තෝරා ගනු ලබන බව යි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. විදේශ සේවා නියුක්ති කාර්යාංශය, නියාමන ආයතනයක් වශයෙන් මෙම තත්ත්වය නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ii. මෙම කරුණ සම්බන්ධව සියලු දත්ත සහ පහත සඳහන් තොරතුරු ඇතුළත් සවිස්රාත්මක වාර්තාවක් විගණකාධිපතිට ද පිටපත් සහිතව මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

- ශ්‍රමිකයින් පුහුණු කිරීම
- පුහුණු කර ඇති ශ්‍රමිකයින් ගණන
- ශ්‍රමිකයින් පුහුණු කිරීම තුළින් උපයා ගෙන ඇති ආදායම් ප්‍රමාණය
- රැකියා සඳහා ගිවිසුම් ගත වීම්
- විදේශ ගත වීමට කැමැති ශ්‍රී ලාංකිකයන් ආයතනයේ ලියාපදිංචි කර ගැනීම
- පුහුණු ආයතනවල ස්වභාවය
- පුහුණුවීම් ඉලක්ක කර ගනු ලබන රටවල්

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළව වර්තමාන තත්ත්වය වාර්තා කර ඇත.

ii. ඉහත නිර්දේශ අංක (i)න් නිර්දේශිත සවිස්තර වාර්තාව ඉදිරිපත් කර නොමැත.

05. <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන කාර්යාංශයේ නිලධාරීන්ගේ කාර්යභාරය</u>

විදේශ රැකියා සඳහා හෝ සංචාරක වීසා මත සංචාරකයන් ලෙස හෝ ව්‍යාපාර කටයුතු සඳහා ඕමාන් සහ ඩුබායි වැනි රටවල් වෙත විදෙස් ගත වන පුද්ගලයන් විදෙස්ගත වන සත්‍ය කාරණාව, ගම් මට්ටමින් නිවැරදිව හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන කාර්යාංශයේ නිලධාරීන්ගෙන් ලබා ගත හැකි සහාය පිළිබඳව කාරක සභාව සාකච්ඡා කරන ලද අතර ඒ පිළිබඳව විධිමත් වැඩසටහනක අවශ්‍යතාවය කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

06. <u>අසත්‍ය මාධ්‍ය ප්‍රචාර</u>

විදේශගත වන සේවිකාවන්ට සිදු වන අපහසුතා පිළිබඳව සන්නිවේදන මාධ්‍ය මඟින් සිදු කරන අසත්‍ය ප්‍රචාර සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු කරන ලද අතර මෙහිදී කාරක සභාවේ අදහස් වූයේ කාර්යාංශය මඟින් මේ පිළිබඳව පවතින සත්‍ය තොරතුරු මාධ්‍යය හරහා සන්නිවේදනය කළ යුතු බවයි.

07. <u>විශේෂ පරීක්ෂණ ඒකකය</u>

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 95/2983/107/125 වූ විදේශ රැකියා සැපයීමේදී සිදුවන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට විශේෂ පරීක්ෂණ ඒකකයක් පිහිටුවීම යන මැයෙන්, කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995.12.14 දිනැති සංදේශය සලකා බලා එම යෝජනාවට අදාළ සියලුම වියදම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ලැබීමට යටත්ව, එක් පොලිස් අධිකාරීවරයෙක්, එක් සහකාර පොලිස් අධිකාරීවරයෙක්, පොලිස් පරීක්ෂකවරු තිදෙනෙක්, උප පොලිස් පරීක්ෂකවරු තිදෙනෙක් සහ පොලිස් සාජන්ට්වරු හය දෙනෙකුගෙන් සමන්විත විශේෂ පරීක්ෂණ ඒකකයක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ අනුමැතිය පරිදි මෙම අමාත්‍ය මණ්ඩල නියෝගය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මේ වන විට කටයුතු සිදු වන ආකාරය සහ කැබිනට් මණ්ඩලය දැනුවත් කිරීමකින් තොරව එම විමර්ශන ඒකකය ඉවත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධව කාරක සභාව විසින් කාර්යාංශයෙන් විමසන ලදී.

මෙහිදී ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් සඳහන් කරන ලද්දේ, 25%ක අමතර දීමනාවක් ද සහිතව මෙම පොලිස් නිලධාරීන්ගේ සියලුම දීමනා සහිත මාසික වැටුප කාර්යංශය මඟින් ගෙවිය යුතු බවට 2015 වර්ෂයේ දී නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයකින් නියෝග කර ඇති අතර ඒ සඳහා එවකට රු. මිලියන 1.8ක් පමණ මුදලක් මාසිකව වියදම් වූ බවයි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

විදේශ රැකියා ක්ෂේත්‍රය ආශ්‍රිතව වර්තමානයේ උද්ගත වී ඇති අධික ගැටලුකාරී තත්ත්වය හමුවේ පොලිස් විමර්ශන ඒකකයක අවශ්‍යතාවය දැඩිව උද්ගත වන බැවින්, අමාත්‍ය මණ්ඩල නියෝග පරිදි මෙම විශේෂ පොලිස් විමර්ශන ඒකකය නැවත ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙම කරුණ සම්බන්ධව අදාළ අංශ සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දැනුවත් කර ඇත.

08. විදේශ ප්‍රේෂණ

රටේ පවතින නීතිය අනුව විදේශ ප්‍රේෂණ නිසි පරිදි එවනු ලබන විදේශ ශ්‍රමිකයන් බදුවලින් නිදහස් වන නමුත්, ඉතා ඉහළ අගයකින් වැටුප් ලබන ශ්‍රමිකයින් පවා විදේශ ප්‍රේෂණ නිසි පරිදි එවීමට කටයුතු නොකිරීම සහ එම තත්ත්වය නිවැරදි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව විමසීම.

මේ සඳහා විශේෂයෙන්ම මැදිහත් විය යුතු වන්නේ ආදායම් බදු දෙපාර්තමේන්තුව වන නමුත් අමාත්‍යාංශය වශයෙන් මැදහත් වීමේ හැකියාව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී.

කාරක සභාවේ නිර්දේශ

මෙම කරුණ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතගේ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිතගේ සහාය ලබා ගනිමින් ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව අමාත්‍යාංශ ලේකම් විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වර්තමාන තත්ත්වය වාර්තා කර ඇත.

09. විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ වැඩසටහන (SSWP - Specified Skilled Worker Program)

ජපානය මගින් හඳුන්වා දී ඇති විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ වැඩසටහන (Specified Skilled Worker Program) සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ගෙන ඇති වැඩපිළිවෙල කුමක්ද යන්න පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මේ සඳහා පැහැදිලි කිරීමක් සිදු කරනු ලැබූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- ජපානයට විදේශිකයින් ගෙන්වා ගනු ලබන ප්‍රධාන ක්‍රම 03ක් පවතින බව,
- ඉහත සඳහන් කළ, විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ වැඩසටහන මින් එක් ක්‍රමයක් බව,
- මෙම වැඩසටහන ලංකාවට විවෘත වන්නේ මෙම වර්ෂයේ සිට බව,
- විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර 14කට අදාළව විදේශිකයන් ජපානයට ගෙන්වා ගනු ලබන බව,
- ලංකාවට දැනට විවෘත කර ඇත්තේ ක්ෂේත්‍ර 03ක් පමණක් බව,
- එනම්,
    - ආහාර පාන සේවා (Food & Beverage Service)
    - සාත්තු සේවා (Care Giver) සහ
    - කෘෂිකර්මාන්තය (Agriculture) බව,

- රජයේ විවිධ ආයතන මේ වන විට මෙම සේවා ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව,
- මේ වන විට කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගනිමින් 4000කට ආසන්න ප්‍රමාණයක් ජපානයේ රැකියා සඳහා යොමු වී ඇති බව,
- භාෂා හැකියාව (ජපන් භාෂාවේ JFT හෝ JLPT(N4) පරීක්ෂණය සමත් වීම), කුසලතා පරීක්ෂණය සමත් වීම හරහා පුද්ගලයෙකුට මෙම වැඩසටහන යටතේ ජපානයට යෑමේ අවස්ථාව උදා වන බව සහ
- මෙම පරීක්ෂණ සඳහා ඉදිරිපත්වීමට නම් භාෂා හැකියාව අනිවාර්ය වන අතර මෙය පුහුණු ආයතන හරහා භාෂාව ඉගැන්වීමේ මූලික අරමුණක් ද වන බව.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

මෙම විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ වැඩසටහන පිළිබඳව සහ මේ සම්බන්ධයෙන් මේ වන විට කාර්යාංශය ලබා ගෙන ඇති ප්‍රගතිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 01)**

10. <u>කාර්යාංශයේ කාර්යභාරය</u>

නියාමන ආයතනයක් ලෙස කාර්යාංශයේ කාර්යභාරය පිළිබඳව කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

මෙහිදී කාරක සභාවේ සහ විගණකාධිපතිගේ මතය වූයේ, ආරම්භයේ දී කාර්යාංශයේ කටයුතු වඩාත් සංකීර්ණ නොවූ නමුත් වර්තමානය වන විට එම කටයුතු වඩාත් පුළුල් සහ තරඟකාරී වී ඇති නිසා කාර්යාංශය විසින් නියාමනය කිරීමේ කාර්යය වැඩි වශයෙන් සිදු කළ යුතු බැවින්, දැනට කාර්යාංශය විසින් සිදු කරනු ලබන පුහුණු කිරීම් ආදී කටයුතු, ජාතික වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වැනි ආයතන හරහා ඉටු කිරීමට කටයුතු කිරීම තුළින් වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබා ගත හැකි වනු ඇති බවත් ඒ අනුව, පනත සංශෝධන කාර්යයේදී කාර්යාංශය මඟින් ඉටු කරනු ලබන මෙම නියාමන කාර්යයට වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කළ යුතු බවත් ය.

11. <u>මූල්‍ය අක්‍රමිකතාවයන්ට අදාළව විනය ක්‍රියාමාර්ග ගැනීම</u>

පසුගිය සභා වාරයේ සාකච්ඡාවට ලක් කරනු ලැබූ පහත දැක්වෙන වටිනාකම රු. මිලියන 248ක් පමණ වූ මූල්‍ය අක්‍රමිකතාවයන් සම්බන්ධව කාර්යාංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු වීම. **(ඇමුණුම 02)**

i. රටවිරු ජාතික පුවත්පත මුද්‍රණය කිරීමේ දී සිදු වී ඇති රු.3,200,000/-ක මූල්‍ය අක්‍රමිකතා.
ii. විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ පාගමන් කොළඹ, ගම්පහ සහ හම්බන්තොට දී පැවැත් වූ බවට හුවා දක්වමින් රු.9,119,909/-ක් වංචා කිරීම.
iii. රටවිරු පවුල්වල සාමාජිකයන්ගේ ප්‍රධානත්වයෙන් පිංකම් මාලාවක් පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 3.5ක් ගෙවීම.
iv. 2014 දෙසැම්බර් මස ඇති වූ නායයාම හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රදේශයේ අවතැන් වූ රටවිරු පවුල්වලට සහන සැපයීමේ මුවාවෙන් රු.3,962,350/-ක් කාර්යාංශයේ අරමුණුවලට පරිබාහිර කටයුතු සඳහා වැය කිරීම.
v. හාලිඇල සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීමේ මුල් ගල තැබීමේ උත්සවයට වියදම් දැරීමේ මුවාවෙන් රු.8,048,648/-ක් කාර්යාංශයේ අරමුණුවලට පරිබාහිර කටයුතු සඳහා වැය කිරීම.
vi. රටවිරු සංවිධාන සවිබල ගැන්වීමට කටයුතු කරන බව හඟවා දේශපාලන කටයුතු සඳහා කාර්ය මණ්ඩල හා කුලී වාහන ලබා දී වැටුප්, දීමනා සහ කුලී ගාස්තු ගෙවීමෙන් රු.9,439,884/-ක් වූ කාර්යාංශ මුදල් අවභාවිතා කිරීම.
vii. පාසල් පොත් හා උපකාරණ කට්ටල බෙදා දීමේ ආධාර වැඩසටහන 2014යටතේ රු.9,543,552/-ක මුදලක් කාර්යාංශයේ අරමුණුවලට පරිබාහිර කටයුතු සඳහා වැය කිරීම.
viii. නායයාම නිසා විපතට පත් මීරියබැද්ද, කොස්ලන්ද ප්‍රදේශයේ රටවිරු පවුල්වලට සහන සලසන මුවාවෙන් රු. 1,000,000/-ක් අවභාවිතා කිරීම.
ix. "රටවිරු පියස" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනට ගෙවීම් නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීම සිදු කළ සියලු නිලධාරීන්ගේ දැනුවත්භාවය මත රජයට අයත් රු.553,570/-ක මුදල් සහ සම්පත් නීති විරෝධීව අවභාවිතා කිරීම සහ කූඨ ලේඛන සකස් කිරීම.
x. 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 15 වන වගන්තියේ දැක්වෙන අරමුණු/ පරමාරමාර්ථ වලින් බැහැර වූ කටයුතු හා ක්‍රියාකාරකම් වෙනුවෙන් කාර්යාංශයේ රු.14,202,350/-ක අරමුදල් උපයෝජනය කිරීම.
xi. 2014 වර්ෂයේ රූපවාහිනී වැඩ වැඩසටහන් හා ප්‍රචාරක දැන්වීම් වෙනුවෙන් කළ රු.139,399,128/-ක වියදම.
xii. "Safety First" රූපවාහිනී වැඩසටහන වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම නිසා රු.9,600,000/-ක අලාභයක් සිදු වීම.
xiii. "තිනෙත" රූපවාහිනී වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වීම නිසා රු.10,000,000/-ක අලාභයක් සිදු වීම.
xiv. E.P.S. ක්‍රමය යටතේ දකුණු කොරියාවට විගමනය වූ ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධන හා ප්‍රවර්ධන කටයුතු සඳහා යැයි හඟවා Bohoon Trust Co. Ltd. ආයතනයට ගෙවීම් කර කාර්යාංශයට රු.17,524,910/-ක අලාභ සිදු කිරීම.
xv. කූඨ ලේඛන පිළියෙල කර වංචනිකව මුදල් ලබාගෙන රාජ්‍ය නොවන සංවිධානයකට පිරිනැමීම නිසා රු.1,693,600/-ක අලාභයක් සිදු වීම.

xvi. රටවිරුවන් දැනුවත් කිරීමේ වැඩ වැඩසටහනට ආහාර පාන ලබා ගැනීමේදී රජයට අයත් රු.661,500/-ක මුදලක් නීති විරෝධී ලෙස භාවිතා කිරීම.

මෙම කරුණු සම්බන්ධව කාර්යාංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ප්‍රමාණවත් අයුරින් විමර්ශනයට භාජනය වී නොමැති බව සහ දඬුවම්වලට භාජනය වූ පුද්ගලයින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත නිදොස් කොට, නිදහස් කර ඇති තත්ත්වයක් කාරක සභාව විසින් නිරීක්ෂණය කළාය.

කාරක සභාවේ නිර්දේශ

i. ඉහතින් සඳහන් කරන ලද සියලු කාරණා පිළිබඳව ස්වාධීන විමර්ශනයක් කිරීම සඳහා ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරන කිරීම.

ii. මෙම පරීක්ෂණ මණ්ඩලය පත්කිරීමේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පිහිටුවා ඇති විමර්ශන නිලධාරී සංචිතයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම කරුණට අදාළව ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරී සංචිතයෙන් සහයෝගය ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාකර සභාව වෙත වාර්තා කර ඇත.

12. මහා භාණ්ඩාගාර නියෝජිතත්වය

කාරක සභාවේ පූර්ව නිරීක්ෂණය පරිදි රාජ්‍ය ව්‍යාපාර ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබන මහා භාණ්ඩාගාර නිලධාරීන්ගේ සේවා කාලය, මාස 2-3ක් වැනි කෙටි කාල පරිච්ඡේදයන්ට සීමා වීම පිළිබඳව කාරක සභාවේ අවධානයට ලක් විය.

කාරක සභාවේ නිර්දේශ

අධ්‍යක්ෂ මණ්ඩලයේ මහා භාණ්ඩාගාර නියෝජිත වශයෙන් පත් කරනු ලබන නිලධාරියා/ නිලධාරිනිය, අදාළ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් වගකීමට බැඳෙන පරිදි නිශ්චිත කාල පරිච්ඡේදයකට (වසර කීපයකට) අදාළව පත් කිරීමට කටයුතු කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - මහා භාණ්ඩාගාරය

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

13. අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය සඳහා දීමනා ගෙවීම

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන සමහර නියෝගවලට පටහැනිව කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් දීමනා ගෙවීමට කටයුතු කිරීමත්, මේ සම්බන්ධව භාණ්ඩාගාර නියෝජිත විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳවත් සහ අවුරුදු ගණනාවක සිට සිදු කර ඇති මෙවැනි අනුමත නොකළ දීමනා සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීම

සඳහා වර්තමානයේ ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් කාරක සභාව විසින් විමසීම් කරන ලදී.

	දීමනා වර්ගය	**එකතුව (රු.) (2019,2020,2021 වර්ෂ සඳහා)**
1	නිල ඇඳුම් වියදම් (2019,2020)	57,423,879
2	නිල ඇඳුම් වියදම් (2021)	7,970,903
3	අවදානම් දීමනාව	122,818,500
4	ගුවන් තොටුපොල ඒකකයේ නිලධාරීන්ට කරනු ලබන ගෙවීම්	12,402,975
5	පැමිණීමේ දීමනා	24,522,000
6	වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ බිල්පත් ප්‍රතිපූර්ණය	107,892,928
7	දේපොළ ණය පොලී ප්‍රතිපූර්ණය කිරීම	27,348,741
8	වාර්ෂික රක්ෂණ දීමනා	2,500,000
9	වාර්ෂික ප්‍රසාද දීමනා (2019,2020)	122,750,665
10	වාර්ෂික ප්‍රසාද දීමනා (2021)	104,198,464
11	වාර්ෂික විශේෂ ප්‍රසාද දීමනා	42,950,172
12	වෘත්තිය දීමනා	19,977,400
	එකතුව	**652,756,627**
	විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා දීමනා	
13	විශේෂ දීමනා	342,355,699
14	ගෙවල් කුලී දීමනා	279,989,904
15	අධ්‍යාපන දීමනා	9,303,882
16	සංග්‍රහ දීමනා	17,932,045
17	වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය	9,635,636
	එකතුව	**659,217,166**

මෙහිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සඳහන් කරන ලද්දේ, ඉහත සඳහන් සමහර දීමනා ගෙවීම් අනුමත කළ නොහැකි බවත්, එසේ අනුමත කළ හොත් එය වෙනත් මෙවැනිම ආයතනවලට වැරදි පූර්වාදර්ශයක් විය හැකි බවත් සහ 03/2022 අයවැය චක්‍රලේඛ අනුව කිසිඳු දීමනාවක් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ගෙවිය නොහැකි බවත් ය.

තවද මේ සම්බන්ධව අදහස් දැක්වූ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් අදහස් දක්වන ලද්දේ,

- ➢ කාර්යාංශය විසින් එම ආයතනය ආදායම් උත්පාදන ආයතනයක් ලෙස අර්ථ දැක්වූව ද සත්‍ය වශයෙන්ම එය ආදායම් උත්පාදනයක් නොව, ආදායම් එකතු කිරීමක් වන බව,
- ➢ ආදායම් උත්පාදන ආයතනයක් ලෙස හුවා දක්වමින් කාර්යාංශයට අභිමත පරිදි, මහා භාණ්ඩාගාර චක්‍රලේඛ/ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ පවා උල්ලංඝනය කරමින් කටයුතු කරන බව සහ

- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් පමණක් විවිධ ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව යි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. වත්මන් භාණ්ඩාගාර නියෝජිත නිලධාරියා, කාර්යාංශයට සම්බන්ධ වූ දින සිට පවත්වනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල රැස්වීම් සටහන් සති 02ක් ඇතුළත විගණකාධිපතිට ද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාර්යාංශ සභාපති වෙත නිර්දේශ කිරීම.

ii. මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ පදනම මත එනම් අනුමැතිය ලබා ගැනීමට පෙර, යම් කිසි දීමනාවක් හෝ වෙනත් ගෙවීමක් සිදු නොකරන ලෙස කාර්යාංශ සභාපති වෙත නිර්දේශ කිරීම.

iii. මහා භාණ්ඩාගාරය චක්‍රලේඛවලට අනුගත වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණ ගැනීමට කටයුතු කිරීම.

iv. මේ වන විට අනුමත නොකරන ලද සියලුම දීමනා වහාම නතර කිරීමට පියවර ගැනීම සහ ඒ පිළිබඳ ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කිරීම.

v. මෙම කරුණ සම්බන්ධව විශේෂ විමර්ශනයක් සිදු කර සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කිරීම.

vi. මේ වන විට ගෙවා ඇති අනුමත නොකළ දීමනා පිළිබඳව නිරාකරණය කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම ගැටලුව නියාමනය කර අවසන් කිරීමට කටයුතු කිරීම සහ මාස 02ක් ඇතුළත මෙහි ප්‍රගතිය පිළිබඳ විස්තර වාර්තාවක් විගණකාධිපතිට ද පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම් සහ කාර්යාංශ සභාපති වෙත නිර්දේශ කිරීම.

vii. ගෙවීමට අවශ්‍ය විශේෂ දීමනා ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයට යොමු කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ අංක (i) අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත.

ii. අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල දීමනා ගෙවීම යන කරුණ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පහත පරිදි දැනුවත් කර ඇත.

  - මෙම කරුණ පිළිබඳව අමාත්‍යතුමා ද දැනුවත් කිරීමට කටයුතු කර අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ බව.
  - මෙම අනුමැතියකින් තොර දීමනා ගෙවීම නතර කිරීමට ප්‍රවේශවීමත් සමඟ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෘත්තීය සමිති විසින් වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළඹීමේ ප්‍රවණතාවයක් ඇති වූ බව.

- ඒ අනුව අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹෙන තෙක් එකී දීමනා අඛණ්ඩව ගෙවීමට කටයුතු කරන බව.

14. <u>රජයට අය විය යුතු බදු මුදල් නිසි පරිදි අය වී නොතිබීම</u>

කාර්යාංශ පනතේ 52(1) ප්‍රකාරව බලපත්‍රලාභියෙකු විසින් ලබාගත් සෑම කොමිස් මුදලකින්ම 5%ක අනුප්‍රමාණයෙන් ගණන් බලනු ලැබූ සෙස් බද්දක් සෑම බලපත්‍රලාභියෙකුගෙන්ම අය කළ යුතු බව සඳහන්ව තිබුණ ද, විගමනය වන ගෘහ සේවකයින් වෙනුවෙන් ලැබෙන කොමිස් මුදලෙහි සත්‍ය වටිනාකම හඳුනා ගැනීමකින් තොරව, රු.100,000/-ක කොමිස් මුදලක් පමණක් ලැබේ යැයි යන උපකල්පනය මත, වර්ෂ 2013 සිට 2020 වර්ෂාවසානය දක්වා රු.5,000/-ක සෙස් බද්දක් පමණක් අය කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙහිදී විගණකාධිපති විසින් අදහස් දක්වමින් සඳහන් කරන ලද්දේ,

- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත, මෙම තත්ත්වය 2021.01.01 දින සිට නිවැරදි කිරීමට කටයුතු කර තිබූ බව,
- 2021.01.01 සිට 2022.11.30 දක්වා විදෙස් ගත වූ ශ්‍රමිකයින් 45,553ගෙන් අය කර ගෙන තිබූ 5%ක සෙස් බද්ද රු.749,131,388/-ක් බව,
- නමුත් පෙර පරිදි රු.100,000/-ක කොමිස් මුදලක් පමණක් ලැබේ යැයි යන උපකල්පනය මත රු.5,000/-ක සෙස් බද්දක් පමණක් අය කළේ නම් එම මුදල රු.227,765,000/-ක් බව,
- ඒ අනුව එක් වර්ෂයක දී පමණක් රු. මිලියන 500ක ආදායමක් පෙන්නුම් කරන බව,
- නමුත් වර්ෂ 2013 සිට 2020 කාලපරිච්ඡේදයට අදාළව, විදේශගත වී ඇති ශ්‍රමිකයින් 557,781ගෙන් සත්‍ය වශයෙන් ම අය වීමට තිබූ මුදල අය නොවීම නිසා විශාල ආදායමක් රජයට අහිමි වී ගොස් ඇති බව, සහ
- වැරදි ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබූ පුද්ගලයින් මෙම අලාභයට වග කිව යුතු බව යි.

මෙහිදී කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් සඳහන් කරන ලද්දේ, මෙම කලින් කරනු ලැබූ ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලැබුවේ උද්ගත වූ යම් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා බව යි. එනම්,

- රැකියා නියෝජිතායතන විසින් නිවැරදි කොමිස් මුදල ප්‍රකාශ නොකිරීම,
- පසුගිය කාලවලදී සමහර රැකියා නියෝජිතායතන විසින් ඒ පිළිබඳව කිසිඳු සඳහනක් නොකිරීම තුළ අදාළ කොමිස් මුදල නිශ්චය කර ගැනීමේ ගැටලු ඇති වීම,
- මෙම කොමිස් මුදල කාලයෙන් කාලයට, වෙළඳ පොළෙන් වෙළඳ පොළට, රැකියා නියෝජිතගෙන් රැකියා නියෝජිතට වෙනස් වීම, සහ
- විදේශගත වූ ශ්‍රමිකයා මාස 06ක් වැනි කාලයක් ඇතුළත රැකියාව අතහැර යාම නිසා කොමිස් මුදලක් නොගෙවීම,

ආදී කරුණු නිසා ඇති වන මෙම වෙනස් වීම මඟහරවා ගැනීම සඳහා වෙළඳ පොළ අධ්‍යයනයක් තුළින් මෙම රු.100,000/-ක කොමිස් මුදල යන්න තීරණ කර ඇති බව යි. තවද, 2021 ජනවාරි මස 01වන දින සිට මෙම තත්ත්වය නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බව තවදුරටත් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.

කාරක සභාවේ නිර්දේශ

වර්ෂ 2013 සිට 2021 දක්වා මෙම තත්ත්වය නිරාකරණය කිරීමට අපොහොසත් වීමට හේතු පැහැදිලි කරන ලද විස්තර වාර්තාවක් විගණකාධිපතිට ද පිටපත් සහිතව අමාත්‍යාංශ ලේකම් හරහා කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම කරුණ පිළිබඳ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ සාමාන්‍යාධිකාරීගේ පැහැදිලි කිරීම, අමාත්‍යාංශ ලේකම්ගේ අංක MFE/FIN/08/12/1 (Vol. IV) හා 2023.01.10 දිනැති ලිපිය මඟින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 03)**

15. ස්ථාවර තැන්පතු

අතිරික්ත ආදායම මහා භාණ්ඩාගාරයට ආදායමට බැර නොකරමින්, එම මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම පිළිබඳව කාරක සභාව විසින් විමසීම් කරන ලදී.

මෙහිදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කරන ලද්දේ, මෙවැනි ආදායම් එකතු කරන ආයතන එම අතිරික්ත ආදායම මහා භාණ්ඩාගාරයට බැර නොකර, ස්ථාවර තැන්පතුගත කිරීම තුළින්, රජයේ ආයතන නඩත්තු කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් අධික පොලියට මුදල් ලබා ගැනීමට සිදු වීම තුළ මහා භාණ්ඩාගාරය බලවත් අසීරුතාවයකට මුහුණ දෙන බවයි.

16. කුවේට් වන්දි අරමුදල් ගිණුම

වර්ෂ 1991 සිට කුවේට් වන්දි අරමුදල් ගිණුම සතුව මේ වන විටත් පවතින රුපියල් බිලියන 04ක පමණ මුදල සම්බන්ධව කාර්යාංශයේ කළමනාකාරීත්වය විසින් කිසිඳු තීරණයක් ගෙන නොතිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම මුදල අදාළ ශ්‍රමිකයන් හඳුනාගෙන ගෙවා අවසන් කර ඇති බවත්, මෙම රුපියල් බිලියන 04ක පමණ මුදල වන්නේ ඉහත මුදල ආයෝජනය කිරීමෙන් ලද සමුච්චිත ආදායමක් බවත් කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.

කාරක සභාවේ නිර්දේශ

කුවේට් වන්දි අරමුදල් ගිණුමේ පවතින මුදල් සම්බන්ධව ඉදිරියේ දී කාර්යාංශය විසින් ගනු ලැබීමට යෝජිත ක්‍රියාමාර්ගය පිළිබඳව යෝජනා පත්‍රිකාව මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම සහ ඒ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම
නිර්දේශිත යෝජනා පත්‍රිකාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

17. ආයෝජන තීරණ ගැනීම
2019 වර්ෂය තුළ දී වටිනාකම රු. 3,484,110,663/-ක් වූ කල්පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර 6ක් එදිනම නැවත ආයෝජනය නොකිරීම නිසා කාර්යාංශයට රු. 5,466,192/-ක ආදායමක් අහිමි වීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු වූ අතර, මෙවැනි විශාල පරිමාණයේ ආයෝජන සම්බන්ධයෙන් තනි නිලධාරියෙකු වෙත වගකීම පැවරීම පිළිබඳව කාරක සභාවේ බලවත් අප්‍රසාදය පල විය.

ආයෝජනය කිරීමේ දී කලින් කලට පොලී අනුපාත අගයන් වෙනස් වන නිසා, ලබා ගත හැකි හොඳම පොලී අනුපාතය බලාපොරොත්තුවෙන් මෙම ප්‍රමාදය ඇති වූ බව මෙහිදී කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු) (වැඩ බලන) විසින් ප්‍රකාශ කරන ලදී.

එසේ වුවද, බලපොරොත්තු වූ හොඳම පොලී අනුපාතය අදාළ කාල සීමාවේ දී ලැබී නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

කාරක සභාවේ නිර්දේශ
කාර්යාංශයේ ආයෝජන තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂ මණ්ඩලයට ඍජුව වග කියනු ලබන, ආයෝජන කමිටුවක් පත් කිරීමට වහාම කටයුතු කිරීම.

නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන
ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම
ප්‍රගතිය වාර්තා කර ඇත.

18. නිල ඇඳුම් සැපයීම
2020 වර්ෂයේ කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සඳහා කමිසයක් රු.2,675/-ක් බැගින් සහ සාරියක් රු.5,425/-ක් බැගින් ලබා ගැනීම සඳහා රු.29,252,225/-ක් සැපයීම් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබීම පිළිබඳව කාරක සභාව විසින් විමසීම් කරන ලදී.

මෙහිදී පහත සඳහන් කරුණු කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

- මෙම සාරි සහ කමිසවලට අදාළ ප්‍රමාණවත් පිරිවිතර සකස් කර ගෙන නොතිබීම පිළිබඳව තාක්ෂණික ඇගැයීම් කමිටුව වගකිව යුතු වීම.
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් පරිදි පිළිගත් ලංසු ඇගැයීම් මූලධර්මවලට අනුකූල ලෙස ලංසු ඇගැයීම් සිදු කර නොතිබුණු අතර, සාරි සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුව ප්‍රතික්ෂේප කර වැඩිම මිල ඉදිරිපත් කර තිබූ ලංසුව නිර්දේශ කර තිබීම.
- මෙම අවම මිල හා නිර්දේශ කළ මිල අතර වෙනස රු. 11,912,150/-ක් වීම.

- ඒ අනුව, මෙම කරුණ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද විමර්ශන නිලධාරියෙකු විසින් මීට අදාළව මූලික විමර්ශනයක් සිදු කර තිබීම.
- එම මූලික විමර්ශනයේ නිර්දේශ අනුව අදාළ ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගැයීම් කමිටු නිලධාරීන් සම්පූර්ණයෙන් වගකිව යුතු වීම.
- මෙම කරුණට වගකිව යුතු බොහෝ නිලධාරීන් මේ වන විට විදේශ ගත වී තිබීම.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම කරුණ සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර මාස 02ක් ඇතුළත විගණකාධිපතිට ද පිටපත් සහිතව කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

ii. පෙර වර්ෂවලට අදාළ විගණන වාර්තාවල යොමු ගත කරුණු සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවේ සාකච්ඡාවට භාජනය වී, මෙතෙක් නිරාකරණය කිරීමෙන් තොරව සහ නොවිසිඳී පවතින කාර්යාංශය සතු සියලුම කරුණු/ ගැටලු/ ගනුදෙනු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් මාස 03ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම් මඟින් විගණකාධිපතිට ද පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

19. <u>විගමනික ශ්‍රමිකයින්ට ගෙවිය යුතු මුදල්</u>

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව විගමනික ශ්‍රමිකයින්ට ගෙවිය යුතු එකතුව රු.790,799,828/-ක් විවිධ හේතූන් මත කාර්යාංශයේ රඳවා ගෙන තිබූ අතර ඉන් රු. 497,415,935/-ක් වර්ෂ 05කට වැඩි කාලයකට අයත් වීම පිළිබඳව සහ එම මුදල් මේ දක්වා රඳවා ගැනීමට හේතු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වීම.

මෙම මුදල ක්‍රම කීපයක් නිසා වසර කීපයක් තිස්සේ සමුච්චිතව කාර්යාංශය සතුව පවතින මුදල් වන බවත්, තවදුරටත් නිරාකරණය නොවී පවතින මුදල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඕනෑම අවස්ථාවක දී නිදහස් කර ගැනීමට යටත්ව කාර්යාංශයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බවත් කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් මෙහිදී සඳහන් කරන ලදී.

විගමන ශ්‍රමිකයින්ට ගෙවිය යුතු මෙම මුදල් ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ එම ක්‍රමවේදය පිළිබඳව මහා භාණ්ඩාගාරය ද දැනුවත් කිරීමට කටයුතු කිරීම වඩාත් සුදුසු බව මෙහිදී විගණකාධිපතිගේ අදහස විය.

20. <u>විදේශ දූත මණ්ඩලයන්හි කම්කරු සුභ සාධන කටයුතු</u>

විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභ සාධන අංශ සඳහා කාර්යාංශය විසින් යවනු ලබන නිලධාරීන් තෝරා ගැනීම සම්බන්ධව කාලීනව උද්ගත වී ඇති සෘණාත්මක පසුබිම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වීම.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභ සාධන අංශ සඳහා කාර්යාංශය විසින් යවනු ලබන නිලධාරීන් තෝරා ගනු ලබන ක්‍රමවේදය පිළිබඳව විශේෂ විමර්ශනයක් සිදු කර අමාත්‍යාංශ ලේකම් මඟින් විගණකාධිපතිට ද පිටපත් සහිතව කාරක සභාව වෙත පහත සඳහන් විස්තර ද ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාර්යාංශයේ සභාපති, සාමාන්‍යාධිකාරී සහ අභ්‍යන්තර විගණක වෙත නිර්දේශ කිරීම.

i. මේ දක්වා විදේශ දූත මණ්ඩලවලට යවා ඇති නිලධාරීන්
ii. වර්තමානයේ විදේශ දූත මණ්ඩලවලට යවන නිලධාරීන්
iii. එම නිලධාරීන්ගේ භාෂා හැකියාව
iv. තෝරා ගැනීමේ දී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

21. <u>රැඳවුම් නිවාස</u>

විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටලුවලට මුහුණ දුන් විගමනිකයින්, තාවකාලිකව රඳවා ගැනීම සඳහා රැඳවුම් නිවාස 12ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, විගණිත දිනය වන විට ඉන් 07ක් වසා දමා රැඳවුම් නිවාස 05ක් පමණක් මෙම සුභසාධන අංශ යටතේ පවත්වාගෙන යමින් පැවතීම පිළිබඳව සාකච්ඡා කිරීම.

කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විදේශ සම්බන්ධතා) විසින් මෙහිදී අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ,

- සුරැකුම් මධ්‍යස්ථාන 12න් ජෝර්දාන්, අබුඩාබි වැනි රටවල්වල පිහිටි මධ්‍යස්ථානවලට රැඳවියන් නොපැමිණි බැවින් එම මධ්‍යස්ථාන 07ක් වසා දැමීමට කටයුතු කිරීමත්,
- ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස කාර්යාංශයේ වියදමින් වෙනත් ආරක්ෂිත මධ්‍යස්ථානයක් කරා එම ශ්‍රමිකයන් යොමු කිරීමත්,
- කුවේට් තානාපතිගේ යෝජනාවක් පරිදි එම රටේ රජයෙන් පවත්වනු ලබන රැඳවුම් මධ්‍යස්ථාන කරා රැඳවියන් යොමු කිරීමට අවසරය ලබා දීමත්,
- බහරේන් රජය විසින් ගත් තීරණයකට අනුව එම රැඳවුම් මධ්‍යස්ථානය ඉවත් කිරීමට සිදු වීමත්, ආදිය නිසා එම රැඳවුම් මධ්‍යස්ථාන වසා දැමීමට සිදු වූ බව යි.

මෙහිදී අමාත්‍යාංශ ලේකම් විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

i. දැනට සුභ සාධන අංශ යටතේ පවත්වා ගෙන යන ඩුබායි, ජෙඩා, ඕමාන්, කටාර් සහ රියාද් යන රැඳවුම් මධ්‍යස්ථානවල පිළිවෙලින් රැඳවියන් 69, 04, 100, 0, 23ක් ලෙස සියලුම රැඳවියන් 196 ක් බව.
ii. ඩුබායිවල සිටින රැඳවියන් 69න් 4ක්, ඕමාන්වල සිටින රැඳවියන් 100න් 59ක් සංචාරක වීසා මත විදෙස් ගත වී ඇති බව.
iii. සංචාරක වීසා මත විදෙස් ගත වී විවිධ හේතූන් මත රැඳවුම් නිවාස වලට එන ලාංකිකයන් වෙනුවෙන් දඩ මුදල්, නඩු කටයුතු ආදිය නිසා අධික මුදලක් වැය කිරීමට සිදු වන බව.
iv. ඒ අනුව මෙම විගමනිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවුනත්, ඔවුන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා කැබිනට් මණ්ඩල සංදේශයක් මඟින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ බව.

22. <u>ආයතනික සැලැස්ම</u>

කාර්යාංශයේ ආයතනික සැලැස්ම යාවත්කාලීන කිරීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු වීම.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

කාර්යාංශයේ ආයතනික සැලැස්ම පහත සඳහන් කරුණු ද ඇතුළත් ව සති 03ක් ඇතුළත යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.

i. කාර්යාංශය විසින් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන ඉලක්ක
ii. ආයතනයේ අනුප්‍රාප්තික සැලැස්ම
iii. ආයතනයේ නියාමන කටයුතු

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

23. <u>ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නැවත කැඳවීම</u>

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිළිබඳව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා, මාස 03කින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට නැවත කැඳවීමට කාරක සභාව තීරණය කිරීම.

24. <u>කාරක සභාවේ නිර්දේශ</u>

කාරක සභාවේ දී මතු වූ පහත සඳහන් කරුණු පිළිබඳව අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කිරීම සහ අදාළ ලිපි පිටපත් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

i. විදේශගත සේවා යෝජකයන් විසින් සනාථ කිරීම සඳහා යොමු කරනු ලබන, වෘත්තිකයන් සඳහා වන අධ්‍යාපන සහතික අප්‍රමාදයකින් තොරව සනාථ කිරීමට කටයුතු කිරීම.
ii. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති විදේශ ගමන් බලපත්‍ර නිකුත් කරනු ලබන කවුළු ප්‍රමාණය වැඩි කිරීම.

iii. විදේශගත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ට විද්‍යුත් වාහන ගෙන්වා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ සුබෝපභෝගී බද්ද වර්තමානයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ අංක (i) හා (ii) අනුව අදාළ අමාත්‍යාංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව කාරක සභාව වෙත දැනුම් දී ඇත.

ii. ප්‍රගතිය වාර්තා කර ඇත.

ඇමුණුම 01

1. ජපානයට විදේශ ශ්‍රමිකයන් බඳවා ගන්නා එක් ක්‍රමවේදයක් ලෙස විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය Specified Skilled Workers Program (SSWP) සඳහන් කළ හැකිය.

2. 2019 ජුනි 19 වන දින ජපානය හා ශ්‍රී ලංකාව අතර අත්සන් කරන ලද සහයෝගීතා ගිවිසුම (MOC) අත්සන් කලද අනුමත කේෂේත්‍ර 14 න් ක්ෂේත්‍ර 03 ක් යටතේ විභාග ලංකාවට ලබා ගත හැකි වූයේ 2022 වසර තුලදීය.

3. SSW වැඩසටහන යටතේ අනුමත ක්ෂේත්‍රයන්හි විභාග ලංකාවට ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් මෙරට ඇති බව සනාථ කිරීම අවශ්‍ය වූ බැවින් මෙලෙස අයදුම්පත් කැඳවන ලද අතර එමගින් පහත සඳහන් විභාග මේ වන විට ලංකාවට ලබා ගත හැකි වී ඇත.

4. 2022 වසරේ ජනවාරි මස ආහාර පිළිගැන්වීම (Food Service) සහ හෙද සාත්තු සේවා (Nursing Care) සම්බන්ධයෙන් වන භාෂා විභාගය සහ කුසලතා විභාගය ශ්‍රී ලංකාවට ලබා දී ඇත.

5. එමෙන්ම 2022 වසරේ ජූලි 29 දින සිට කෘෂිකාර්මික (Agriculture) ක්ෂේත්‍රයේ භාෂා හා කුසලතා විභාග ලංකාව සඳහා ලබා දෙන ලදී.

6. භාෂා හැකියාව (ජපන් භාෂාවේ JFT හෝ JLPT (N4) පරීක්ෂණය සමත්වීම), කුසලතා පරීක්ෂණය සමත්වීම හරහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකිකයින්ට ඉහත විභාගයන්ට පෙනී සිටීමෙන් අනතුරුව සුදුසුකම් සපුරාගත් පසු SSW වැඩසටහන සඳහා දැනට අනුමත ක්ෂේත්‍රයන්හි රැකියා ලබා ගැනීමට හැකියාව ඇත.

7. මෙම විභාග සඳහා පෙනී සිටින ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම අපේක්ෂකයින් දිරි ගැන්වීම සඳහා විවිධ වැඩසටහන් කාර්යාංශය හා අනෙක් අදාළ ආයතන මගින් කටයුතු කරමින් සිටී.

8. තවද, දැනට අනුමත නොවූ ක්ෂේත්‍ර 11 ක් අතුරින් ශ්‍රී ලාංකිකයින් සඳහා ඉල්ලුමක් ඇති විය හැකි ක්ෂේත්‍ර එනම් ඉදිකිරීම් (Construction), ගොඩනැඟිලි පිරිසිදු කිරීමේ කළමනාකරණ (Building Cleaning Management), ධීවර ක්ෂේත්‍රය (Fishery and Aquaculture) හා නිෂ්පාදන ක්ෂේත්‍රය, ආහාරපාන, ආහාරපාන සැකසීම සහ කර්මාන්ත යන්ත්‍රෝපකරණ (Manufacturing of Food and Beverages, Food Processing and Industrial Machinery) යන ක්ෂේත්‍ර සඳහා පවතින අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් ජපාන රාජ්‍යයේ අධිකරණ අමාත්‍යතුමා වෙත ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 03.)

9. ජපන් රජය SSW වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික ආයතනයක් වන ආගමන සේවා ඒජන්සි ආයතනය (Immigration Service Agency – ISA) දන්වා ඇති පරිදි 2022 වසරේ ඉහත අනුමත විභාග සඳහා ලංකාවෙන් ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් ප්‍රමාණය සාපේක්ෂව පහළ අගයක් ගෙන ඇත. අදාළ දත්ත ඇමුණුම් 04 ඉදිරිපත් කර ඇත.

10. SSW වැඩසටහන ලංකාව තුල ප්‍රචලිත කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග මේ වන විට කාර්යාංශය විසින් ගෙන ඇත.

   i. ජපානය විසින් පිළිගත් භාෂා විභාග ඉලක්ක කර ගනිමින් 5000 ක ජපන් භාෂා ප්‍රවීනතාවය සහිත ශ්‍රමික පිරිසක් ඉදිරි මාස 12 තුල නිර්මාණය කිරීම. මේ යටතේ ජපන් භාෂා උගන්වනු ලබන රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සහසම්බන්ධයෙන් කටයුතු කරන අතර ගුරු භවතාගේ ගාස්තු කාර්යාංශය විසින් ප්‍රතිපූර්ණය කරනු ඇත.

   ii. ඉදිරි වසර 02 ක කාලය තුල SSW වැඩසටහන මෙරට තුල ප්‍රචලිත කිරීම සඳහා වූ යෝජනාවලියක් වෙනුවෙන් JICA ආයතනයේ තාක්ෂණික හා මූල්‍ය සහයොගය ලබා ගැනීමට සකස් කළ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද පසු මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

iii. SSW වැඩසටහන යටතේ බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම සඳහා අවබෝධතා ගිවිසුම් 02 ක් 2023 මුල් කාර්තුව තුල අත්සන් කිරීමට නියමිතව ඇත. ජපානයේ රැකියා සඳහා බඳවා ගන්නා ප්‍රධාන පෙළේ ආයතනයන් වන IM JAPAN ආයතනය හා TECHNO WORKERS ආයතනය සමඟ මෙලෙස කාර්යාංශය ගිවිසුම් ගත වීමට සැලසුම් කර ඇත. මෙමගින් විභාග සමත්වන්නන් සඳහා රැකියාගත කිරීම අපේක්ෂා කෙරේ.

iv. ජපානයේ . ආගමන සේවා ඒජන්සි ආයතනය (Immigration Service Agency – ISA) විසින් සංවිධානය කරනු ලබන මාර්ගගත රැකියා ප්‍රවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පූර්ව දැනුවත් කිරීම මගින් ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශයව SSW වැඩසටහනට ආකර්ශනය කර ගැනීම. මේ යටතේ 2023 පෙබරවාරි 04 සහ 05 යන දිනයන්හිදී නව වැඩසටහනක් පැවැත්වේ. (ඇමුණුම 05)

v. SSW වැඩසටහන යටතේ 2022 වසර තුල ලද රැකියා ඇනවුම් සහ රැකියා ගත වීම් ඇමුණුම 06 මගින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02

මූල්‍ය අක්‍රමිකතා සිද්ධියට අදාල විනය ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳ සාරාංශ වාර්තාව

	මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විස්තර	මුදල රු.	විමර්ෂණ වාර්තා නිර්දේශ	විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ විගණන නිරීක්ෂණ
1	රටවිරු ජාතික පුවත්පත මුද්‍රණය කිරීමේදී සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතා	3,200,000	මීට අදාලව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ අනුව සිද්ධියට සම්බන්ධ වූ නිලධාරීන් දෙදෙනෙකුට විරුද්ධව කාර්යාංශයේ සභාපති (පත්වීම් බලධාරියා) විසින් 2019 මැයි 24 දින විනය නියෝග නිකුත් කර තිබුණි. ආර්.කේ.කේ.එන්.පී.රන්දෙණිය (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි)/ කේ.එස්.ටී.එම් කුලරත්න (පරිපාලන නිලධාරී) යන නිලධාරීන්ට පිළිවෙළින් රු.1,525,000 ක මුදලක් සමාන වාරික වලින් වසර 9 කදී වැටුපෙන් අඩු කිරීම සහ රු.1,675,000 ක මුදලක් සමාන වාරික වලින් වසර 9 කදී වැටුපෙන් අඩු කිරීම ඇතුළු තවත් කරුණු තුනක් යටතේ දඬුවම් පනවා තිබුණි.	මූලික විමර්ෂණ නිලධාරී විශ්‍රාමගිය නිලධාරියකු බැවින් ඔහුගේ වාර්තාව පිළිගත නොහැකි අතර රන්දෙනිය මහතා වෙත නිකුත් කළ විනය නියෝගය සම්බන්ධයෙන් ඔහු විසින් එවා ඇති අභියාචනයක් සලකා බලා පරීක්ෂණ කමිටුවක් පත්කල බව 2019 මැයි 24 දින ලිපියෙන් කාර්යාංශයේ සභාපති වෙත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි. එම පරීක්ෂණ වාර්තාව අනුව ඉහත කී විනය නියෝගය පූර්ණ වශයෙන් නීතියට පටහැනි බවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන විනය නියෝගය අහෝසි කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ කමිටුව මගින් 2019 ජූලි 19 දිනැති ලිපිය මගින් කාර්යාංශ වෙත දන්වා තිබුණි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම නිලධාරියා නිදොස් කොට නිදහස් කර තිබුණි. එම තීරණය මත පදනම්ව අනෙකුත් නිලධාරීන්ද නිදොස් කොට නිදහස් කර තිබුණි. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෙම නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබූ මුදල විදේශ දූත මණ්ඩලවලින් ලැබිය යුතු මුදලක් ලෙස සටහන් කර තිබී 2021 වර්ෂයේ ජ'නල් සටහනක් මගින් කපාහැර තිබුණි.
2	විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ පාගමන් කොළඹ, ගම්පහ හා හම්බන්තොටදී පැවැත්වූ බවට හුවා දක්වමින් රු.9,119,909 ක්			

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

15

	වංචා කිරීම.			
	i. 2014 අප්‍රේල් 27 සහ 29 දිනයන්හි කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල පැවැත්වූ පාගමන් සඳහා ආහාර සැපයීම.	2,854,000	මූලික විමර්ෂණ වාර්තාව අනුව, අලෙවි ප්‍රවර්ධන විධායක නිලධාරි ලෙස කටයුතු කර දැනට සේවයෙන් ඉවත්ව ගොස් ඇති එක්සිත් හපන්ගම මහතා චෝදනාවට ලක්ව තිබුණි. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මෙම ගෙවීම සහතික කළ, නිර්දේශ කළ සහ අනුමැතිය ලබා දුන් නිළධාරීන් පිළිබඳව මූලික විමර්ෂණ වාර්තාවේ සඳහන් කර නොතිබුණි.	මෙම සිද්ධි 04 පිළිබඳව 2016 හා 2017 වර්ෂවල සිදු කරන ලද මූලික විමර්ෂණවලින් දී ඇති නිර්දේශ අනුව වැඩිදුර පරීක්ෂණ සඳහා එම වාර්තාව පොලිස් මූල්‍ය අපරාධ විමර්ෂන කොට්ඨාශය වෙත යොමුකල බව විගණනයට දන්වා තිබුණි. විගණන දිනය වූ 2022 ඔක්තෝබර් 19 දිනය වන විටත් පර්යේෂණ නිමකර වාර්තා එවා නොතිබුණි. මේ පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තු නිර්දේශය වී තිබුණේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු විමර්ෂණ අවසන් වූ පසු ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බවයි.
	ii. ටීෂර්ට්හාතොප්පිමිලදීගැනීම (කොළඹහාගම්පහපාගමන්)	3,627,000	මූලික විමර්ෂණ වර්තාවට අනුව, වැඩ සටහන සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අවිධිමත්ව කටයුතු කළ අලෙවි ප්‍රවර්ධන විධායක නිලධාරි එක්සිත් හපන්ගම සහ භාණ්ඩ ලද බවට සහතිකයකින් තොරව ගෙවීම් සහතික කළ නිලධාරිනියකද චෝදනාවට ලක්ව තිබුණි.	
	iii. බැලුන් හා බැනර් මිලදී ගැනීම (කොළඹ හා ගම්පහ පා ගමන්)	925,309	හිටපු අලෙවි ප්‍රවර්ධන විධායක නිලධාරි එක්සිත් හපන්ගම මහතා මීට අදාළ මූලික විමර්ෂණයේදී චෝදනා ලැබ තිබුණි.	
	iv. ප්‍රදර්ශණ රථය, බැනර්, පොස්ටර්, අත් පත්‍රිකා ලබා ගැනිම - හම්බන්තොට පා ගමන	1,713,600	හිටපු අලෙවි ප්‍රවර්ධන විධායක නිලධාරි එක්සිත් හපන්ගම මහතා මීට අදාළ මූලික විමර්ෂණයේදී චෝදනා ලැබ තිබුණි.	

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

16

<table>
<tr>
<td>3</td>
<td>රටවිරු පවුල් වල සාමාජිකයන්ගේ ප්‍රධානත්වයෙන් පින්කම් මාලාවක් පැවැත්වීම වෙනුවෙන් රුපියල් මිලියන 3.5 ක් ගෙවීම.
i.කිරි අම්මාවරුන්ගේ දානය සඳහා
ii.මහා සංඝරත්නයට පිරිකර සඳහා</td>
<td>1,500,000
2,000,000</td>
<td>මෙම සිද්ධියට අදාළ මූලික පරීක්ෂණයට අනුව නිලධාරීන් තිදෙනෙකු විසින් අමාත්‍යවරයාගේ දේශපාලන දිවියට වසර 25 ක් සපිරීම හේතුවෙන් සංවිධානය කළ උත්සවයක් සම්බන්ධ කර පිළියෙල කරන ලද ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර කාර්යාංශයේ කම්කරු හා සුභසාධන අරමුදල් අවභාවිතා කිරීමට චෝදනා ලැබ තිබුණි අතරථය ආයතන සංග්‍රහයේ පළමු උප ලේඛනයට අයත් බරපතල විෂමාචාරයක් ලෙස දක්වා තිබුණි. එමෙන්ම එම වරද සිදු කිරීමට බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම සහ ගෙවීම යන කරුණු සඳහා ඊට සම්බන්ධ නිලධාරීන් තිදෙනෙකු තනිතනිව හා සාමූහිකව වග කිව යුතු බව දක්වා තිබුණි.</td>
<td>i. කිරි අම්මාවරුන්ගේ දානය සඳහා පිරිකර මිලදී ගැනීම
<table>
<tr><th>චෝදනාවට ලක්වූ නිලධාරීන්</th><th>ගෙන ඇති ක්‍රියාමාර්ගය</th></tr>
<tr><td>කේ.කේ.ඩී.ඒ.ජී.කරුණා තිලක මහතා (කළමණාකරු)</td><td>චෝදනා වලින් නිදහස් කර අවවාද කර තිබුණි.</td></tr>
<tr><td>ආර්.ඩී.ආර්.ආර්.රූපසිංහ මිය (වැ.බ සහකාර කළමණාකරු - මුදල්)</td><td>චෝදනා වලින් නිදහස් කර අවවාද කර තිබුණි.</td></tr>
<tr><td>සුරේෂ් කුමාර් මහතා (බදුල්ල කාර්යාංශ පළාත් කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී)</td><td>වෙනත් සිද්ධියකට අදාල විධිමත් විනය පරීක්ෂණයකින් 2022.01.10 දිනැති ලිපිය මඟින් කාර්යාංශයේ සේවයෙන් පහකර ඇත</td></tr>
</table>
ii. මහා සංඝරත්නයට පිරිකර පූජා කිරීම හා පිරිවෙන් වලට මූල්‍යමය ආධාර පිරිනැමීම.
<table>
<tr><td>කිෂෝලි පෙරේරා (අතිරේක සාමාන්‍යාධිකාරි)</td><td rowspan="3">2018/12/27 දින මෙම නිලධාරීන් තිදෙනාට චෝදනාපත්‍ර නිකුත් කර ඇති අතර එම චෝදනා පත්‍ර සඳහා ලබා දී ඇති පිළිතුරු සලකා බලා එම නිලධාරීන් චෝදනාවලින් නිදහස් කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ෂණයක්</td></tr>
<tr><td>එම්.ජී.එස්.තෙන්නකෝන් මිය (රාජකාරිආවරණ)</td></tr>
<tr><td>සුරේෂ් කුමාර් මහතා (බදුල්ල කාර්යාංශ පළාත්</td></tr>
</table>
</td>
</tr>
</table>

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

17

				කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී) — කරනු ලබන බවත් එහි වර්තමාන තත්ත්වය පිළිබඳ කාර්යාංශයට තොරතුරු ලැබී නොමැති බවත් වාර්තා වී තිබුණි.
4	2014 දෙසැම්බර් මස ඇතිවූ නායයාම හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රදේශයේ අවතැන් වූ රටවිරු පවුල් වලට සහන සැපයීම මුවාවෙන් රු.3,962,350 ක් කාර්යාංශයේ අරමුණු වලට පරිබාහිර කටයුතු වෙනුවෙන් වැය කිරීම.	3,962,410	අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද විමර්ෂණයට අනුව වැඩ බලන සහකාර කළමනාකරු සුරේෂ් කුමාර් මහතා සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු චෝදනාවට ලක්ව ඇත.	සුරේෂ් කුමාර් මහතා (බදුල්ල කාර්යාංශ පළාත් කාර්යාලයේ ස්ථාන භාර නිලධාරී) — 2022/01/10දින කාර්යාංශ සේවයෙන් පහකර ඇත. එච්.එම්.ඩී.පී හේරත් මිය (වැඩ බලන සහකාර කළමණාකරු - මුදල්) — සභාපතිතුමා විසින් කරුණු විමසා අවවාද කිරීමක් කර තිබුණි. එම්.ජී.එස්.තෙන්නකෝන් (සහකාර කළමණාකරු) — සභාපතිතුමා විසින් කරුණු විමසා අවවාද කිරීමක් කර තිබුණි. • මෙම සිද්ධිය සම්බන්ධයෙන් තවදුරටත් විමර්ෂණය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කර ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භකර ඇති බවත් වාර්තා කර තිබුණි.
5	හාලි ඇල සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීමේ මුල්ගල තැබීමේ උත්සවයට වියදම් දැරීමේ මුවාවෙන් රු.8,048,648 ක් කාර්යාංශයේ අරමුණුවලට පරිබාහිර කටයුතු වෙනුවෙන් වැය	8,048,648	මුල්ගල තැබීමේ උත්සවය සඳහා සම්පූර්ණ වශයෙන් වැය කර ඇති මුදල රු. 9,157,060 කි. ඉන් රු.8,048,648 ක් අනාර්ථික ලෙස කාර්යාංශයේ අරමුණු වලට පරිබාහිර වෙනත් කටයුතු සඳහා වැය කර තිබීම පිළිබඳ විස්තර විශේෂ විමර්ෂණ වාර්තාවේ සඳහන් වුවත් ඒ පිළිබඳ	මූලික පරීක්ෂණයෙන් මූල්‍යමය වංචාවක් සිදුවී නොමැති බවට සඳහන් කර ඇත. කෙසේ වුවද මුල්ගල් තැබූ ස්ථානයෙහි අනුරුවක් පමණක් විවෘත කර ඇති බවත් ඊට ඉදිරිපස හාලිඇල ක්‍රීඩාංගනයේ ඌව පලාත්සභා මැතිවරණය වෙනුවෙන් ඌව පළාත් කාන්තා සම්මේලනය දේශපාලන රැස්වීම පැවැත්වීමට මෙම වියදම් දරා ඇති බව විගණන වාර්තා අනුව නිරීක්ෂණය විය. එසේම මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

18

	කිරීම.		මූලික විමර්ෂණයේ දී අවධානය යොමු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින්ද පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව වාර්තා කර තිබුණි.
6	රටවිරු සංවිධාන සවිබල ගැන්වීමට කටයුතු කරන බව හඟවා දේශපාලන කටයුතු සඳහා කාර්යමණ්ඩල හා කුලී වාහන ලබාදී වැටුප්, දීමනා හා කුලී ගාස්තු ගෙවීමෙන් රු.9,439,884 ක් වූ කාර්යාංශ මුදල් අවභාවිතා කිරීම.	9,439,884	රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් සුසිල් රණසිංහ මහතාට එරෙහි නීතිමය පියවර ගත යුතු බවත්, එම කාලය තුළ තමාට නියමිත රාජකාරි පැහැර හැර ඇති බවට වූ චෝදනා ඔප්පුවී ඇති නිලධාරීන්ගෙන් එම කාලයට අදාළව ගෙවා ඇති වැටුප නැවත අය කිරීමටත් නිර්දේශ කර තිබුණි. චෝදනාවට ලක්වූ නිලධාරීන් • සුරේෂ් කුමාර් මහතා (බදුල්ල පළාත් කාර්යාලය ස්ථාන භාර නිලධාරී) • එච්.එම්.බී.පී හේරත් මිය (වැඩ බලන සහකාර කළමණාකරු - මුදල්) • එච්. බටගොඩ මයා (හිටපු සාමාන්‍යාධිකාරි) • සුසිල් රණසිංහ මයා (හිටපු වැඩ බලන සභාපති)	මූලික විමර්ශණ වාර්තාවේ ඇතුලත් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති අතර විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමෙන් තොරව නැවත මූලික විමර්ෂණයක් සිදු කිරීමට 2018 ඔක්තෝබර් 18 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.මුදල් සහ ප්‍රසම්පාදනය පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් මෙම විමර්ෂණය සිදුකල යුතු බවට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය වී තිබුණද පත්කර යුතු බව මූලික පරීක්ෂණයක් සිදු කිරීමට එක් නිලධාරියකු පත්කර තිබුණි. මූලික විමර්ෂණයට අනුව අදාල කටයුත්ත පනතේ විධිවිධාන වලට අනුකූලව සිදුවී ඇතත් එහිදී මුදල් අවභාවිතයත් වාහන අවභාවිතයත් සිදු වී ඇති බවත් එය මෙම සිද්ධියට සම්බන්ධ කාර්යාංශ නිලධාරීන් දෙදෙනාගේ අනුදැනුම අනුව සිදුවී ඇති බව පෙනී ගිය බවත්,ඔවුන් සාක්ෂි ලබාදීමට නොපැමිණ ඇති නිසා අවසන් නිගමනයකට ඒමට නොහැකිවී ඇති බවත්,සිද්ධියට සම්බන්ධ අනෙක් පුද්ගලයින් දෙදෙනා දැනට කාර්යාංශ සේවයේ නොසිටින නිසා ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත නොහැකි වී ඇති බවත් වාර්තාවී තිබුණි. එසේම වංචා විමර්ෂණ ඒකකයසහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙන බව වාර්තා කර තිබුණි.
7	පාසල් පොත් හා උපකරණ කට්ටල බෙදා දීමේ ආධාර වැඩ සටහන 2014	9,543,552	මූලික විමර්ෂණ වාර්තාවට අනුව චෝදනාවට ලක්ව ඇති ටී.කොඩේෂ්වරන් නැමති නිලධාරියා විසින් බරපතල විෂමාචාරයක් සිදු කර ඇති බව	මීට අදාල අභ්‍යන්තර විමර්ෂණ කටයුතු අවසන් කර මූලික විමර්ෂණ වාර්තාව අල්ලස් හෝ දූෂණ කොමිසම වෙත 2017 සැප්තැම්බර් 28 දින යොමුකර නැවත 2018 ඔක්තෝබර් 28 දිනැති ලිපිය මගින් එම පැමිණිල්ල

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

19

	විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල් කාර්යාංශයේ අරමුණුවලට පටහැනිව දේශපාලන කටයුතු සඳහා අවභාවිතා කිරීම.		විධිමත්විනය පරීක්ෂණයේදී ඔප්පු වී වැඩ තහනම් කළ යුතු බවට නිර්දේශ කර තිබුණි.	ඉවත්කර ගැනීමට ඉල්ලුම් කර තිබුණි. එමෙන්ම කාර්යාංශය විසින් එම නිලධාරියාගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කර නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර තිබුණි. අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන විමර්ෂණ අවසන් වීමෙන් අනතුරුව, ඉදිරි කටයුතු කල යුතු බව නීතිපති විසින් ලිඛිතව දක්වා තිබුණි. ඉදිරි කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවුණු බැවින් ඒ පිළිබඳව ඉදිරි කටයුතු නොකිරීමට අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව වාර්තා වී තිබුණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද මීට අදාල විමර්ෂණයක් සිදුකරන බව වාර්තා කර තිබුණි.
8	නාය යෑම නිසා විපතට පත් මිරියබැද්ද කොස්ලන්ද ප්‍රදේශයේ රටවිරු පවුල්වලට සහන සලසන මුවාවෙන් රු. 1,000,000 ක් අවභාවිතා කිරීම.	1,000,000	විධිමත් විනය පරීක්ෂණයකට අනුව මෙම කටයුත්ත අවිධිමත් පරිදි සිදු කිරීම පිළිබඳව නිලධාරීන් 4දෙනෙකු චෝදනා ලැබ තිබුණි. එමෙන්ම මෙම නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට සුදුසු බව සහ සිදු වූ අලාභය අදාළ නිලධාරීන්ගෙන් අය කළයුතු බවට නිර්දේශ කර තිබුණි.	**නිර්දේශ ක්‍රියාත්මක කිරීම** ආර්.කේ.කේ.එම්.පී. රන්දෙණිය – සියලු චෝදනා වලින් නිදහස් කිරීම සුරේෂ් කුමාර් – 2022.01.10 වෙනත් විධිමත් විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස කාර්යාංශ සේවයෙන් පහකර තිබීම ආර්.ඒ.ඩී.ආර්. රූපසිංහ – වැටුප් වර්ධක 03 ක් විලම්භනය කිරීම හා අවවාද කිරීම ආර්.කේ.එස්.ටී.එම්. කුලරත්න – සියලු චෝදනා වලින් නිදහස් කිරීම • අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද මීට අදාලව විමර්ෂණයක් සිදුකරන බව දන්වා තිබුණි.
9	"රටවිරු පියස" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ගෙවීම් නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීම සිදුකල සියලු	553,570	මූලික විමර්ෂණ වාර්තාවට අනුව පහත නම් සඳහන් නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුව තිබුණි. • ආර්.කේ.කේ.එම්.පී. රන්දෙණිය මහතා	මීට අදාලව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. සිදු වී ඇති අලාභය අයකර ගැනීම පිළිබඳ අවධානය යොමු නොකර සිද්ධියට සම්බන්ධ නිලධාරීන් දෙදෙනෙකුට අවවාදාත්මක ලිපි යොමු කර තිබුණි එස්.සුරේෂ් කුමාර් මහතාට පමණක් චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණු

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

20

	නිලධාරීන්ගේ දැනුවත්භාවය මත රජයට අයත් හිතාමතා අයතුසහගත හෝ නීතිවිරෝධීව අවභාවිතා කිරීමට කටයුතු කිරීම හා ඒ වෙනුවෙන් කූඨ ලේඛණ සකස් කිරීම.		• ආර්.ඩී.ආර්.ආර්. රූපසිංහ මිය • එස්.සුරේෂ් කුමාර් මයා	අතර 2022 ජනවාරි 10 දින වෙනත් විධිමත් විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස එම නිලධාරියා කාර්යාංශ සේවයෙන් පහ කර තිබුණි.මෙ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ෂණයක් සිදුකරන බව දන්වා තිබුණි.
10	1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 15 වගන්තියේ දැක්වෙන අරමුණු / පරමාර්ථ වලින් බැහැර වූ කටයුතු හා ක්‍රියාකාරකම් වෙනුවෙන් කාර්යාංශයේ අරමුදල් උපයෝජනය කිරීම.	14,202,350	මෙම සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර හෝ විශේෂ අපරාධ අංශයට යොමු කර තව දුරටත් පරීක්ෂණ කිරීමට මූලික විමර්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කර තිබුණි.	2019 ජුනි 19 දින මීට අදාල වාර්තාව මූල්‍ය අපරාධ විමර්ෂණ කොට්ඨාශය වෙත යොමුකර තිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ෂණයක් ආරම්භ කර ඇති අතර එහි විමර්ෂණ අවසන් වූ පසු එළැඹෙන නිගමනයන් ආශ්‍රයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව නීතිපති විසින් දන්වා තිබුණි.
11	රූපවාහිනී වැඩසටහන් හා ප්‍රචාරක දැන්වීම් වෙනුවෙන් කළ වියදම (2014 වර්ෂය) ඉලක්ක කල අරමුණු සාක්ෂාත් කර ගැනීම හා ඇගයීම සඳහා වූ පසුවිපරම් කටයුතු ඉටුකිරීමේ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබීම ඒ හේතුවෙන් අවිධිමත් ප්‍රචාරක දැන්වීම් සඳහා අධික ලෙස කාර්යාංශයේ මුදල් වැය කිරීම.	139,399,128	අභ්‍යන්තර විගණන ඒකකය මඟින් මීට අදාලව විමර්ෂණයක් සිදු කර තිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තාව පදනම් කරගෙන නිදහසට කරුණු විමසූ නිලධාරීන් විසින් ලබා දී ඇති පිළිතුරු අනුව සභාපති තුමා විසින් තීරණයක් ගැනීමට නියමිතව පවතින බව සහ මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ෂණයක් සිදුකරන බව දන්වා තිබුණි.

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

12	"Safety First" රූපවාහිනී වැඩසටහන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි ලංසු කැඳවීම් නොකර "ශ්‍රී ටීවී" ආයතනය ඉදිරිපත් කල රු. 1,600,000 ක් වූ මුදල එලෙසම පිළිගෙන රේඛීය අමාත්‍යවරයාගේ සහ සභාපතිගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම.	9,600,000	මූලික විනය පරීක්ෂණයට අනුව පහත නම් සඳහන් නිලධාරින්ට අදාලව මූල්‍ය විෂමාචාරයන් සහ මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම ඇතුලත් චෝදනා පත්‍ර නිකුත් කර තිබුණි. නිලධාරියාගේ නම — ලබා ඇති චෝදනා ගණන ආර්.කේ.කේ.එම්.පි.රන්දෙණිය — 10 කේ.කේ.ඩී.ඒ.පී.කරුණාතිලක — 05 එම්.පී.එස්.තෙන්නකොන් — 09 කේ.එස්.ටී.එම්.කුලරත්න — 09	මීට අදාල විධිමත් විනය පරීක්ෂණයට අනුව කේ.එස්.ටී.එම් කුලරත්න මහතාට අවවාද කරමින් ලිපි යැවීමටත් අනෙකුත් නිලධාරීන් සියලු චෝදනා වලින් නිදහස් කිරීමටත් කාර්යාංශයේ සභාපති කටයුතු කර තිබුණි.ඒ අනුව, එම කටයුත්තේදී සිදුවී ඇති මූල්‍ය විෂමාචාරයන් පිළිබඳව වගකිව යුත්තෙකු නිශ්චය කර ගැනීමට කාර්යාංශයට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද විමර්ෂණයක් සිදුකරන බව දන්වා තිබුණි.
13	තිනෙත ටීවී වැඩසටහන් සඳහා අනුග්‍රහය ලංසු කැඳවීමකින් තොරව වටිනාකම රු. 10,000,000 ක් වූ දැන්වීම් විකාශනය සඳහා වූ කොන්ත්‍රාත්තුවක් තිනෙත ටීවී ආයතනයේ හිටපු සභාපති විසින් ඔහුගේ අභිමතය පරිදි පැවරීම	10,000,000	මූලික විමර්ෂණ වාර්තාවට අනුව, හිටපු සභාපති අමල් සේනාලංකාධිකාර මහතා චෝදනා ලැබ තිබුණි. මේ පිළිබඳ දැනුම සහිත පාර්ශවයකට ඉදිරි විමර්ෂණ සඳහා යොමු කරන ලෙස එම වාර්තාවේ සඳහන්ව තිබුණි.	මූලික විමර්ෂණ වාර්තාවටඅනුව එම පරීක්ෂණ කටයුතු සංකීර්ණ බැවින් ඒ සම්බන්ධ විශේෂ දැනුම සහිත පාර්ශවයකට ඉදිරි විමර්ෂණ සඳහා යොමු කළ යුතු බව තීරණය කර2017 සැප්තැම්බර් 29 දින මූල්‍ය අපරාධ විමර්ෂණ කොට්ඨාශය වෙත මෙම සිද්ධිය යොමුකර ඇත.අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව නැවත මූලික විමර්ෂණ සිදුකිරීම සම්බන්ධයෙන් නීතිපතිතුමා විසින් විමසීම් කරන ලද අතර එතුමාගේ 2022 මැයි 17 දිනැති ලිපියට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන විමර්ෂණ අවසන් වීමෙන් අනතුරුව එකී දෙපාර්තමේන්තුව විසින් එලැඹෙන නිගමනයන් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව දන්වා තිබුණි.
14	E.P.Sක්‍රමය යටතේ දකුණු කොරියාවට විගමණය වූ ශ්‍රී ලාංකීකයන්ගේ සුභසාධන හා	17,524,910	මේ සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ෂණයට අනුව කාර්යාංශයට අලාභයක් සිදු වී නොමැති බව තීරණය කර ඇත.	මූලික විමර්ෂණ වාර්තාව අනුව පරීක්ෂණ කටයුතු නිම කර ඇත.

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

22

<table>
<tr><td></td><td>ප්‍රවර්ධන කටයුතු සඳහා යැයි හඟවා Bohoon Trust Co. Ltd ආයතනයට ගෙවීම් කර කාර්යාංශයට අලාභ සිදු කිරීම (2012/11/14 – 2013/05/24)</td><td></td><td></td><td></td></tr>
<tr><td>15</td><td>කුඨ ලේඛන පිළියෙල කර වංචනිකව මුදල් ලබාගෙන රාජ්‍ය නොවන සංවිධානයකට පිරිනැමීම.</td><td>1,693,600</td><td>මේ පිළිබඳසිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණකින් අනතුරුව චූදිත නිලධාරියා වෙත චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණි.</td><td>මීට අදාලව චෝදනාවට ලක්වූ එවකට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීව සිටි ආර්.කේ.කේ.එම්.පී. රන්දෙනිය මයා - වෙත 2016 මාර්තු 09 දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර, ඔහුගේ පිළිතුර සලකා බලා ඉහත කී මුදල රු. 846,800 ක් බැගින් වන වාරික 02 කින් අයකර ගැනීමටත්, රු.222,481.60 ක පොළී මුදලක් අයකර ගැනීමටත්, වැටුප් වර්ධක 02 ක් විලම්භනය කිරීමටත් කටයුතු කර තිබුණි. සිද්ධිය සම්බන්ධ කාර්යාංශ නිලධාරීන් තිදෙනෙකු වෙත විනය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර පරීක්ෂණ අවස්ථාව වන විට කාර්යාංශ සේවයේ නොසිටි නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල වාර්තා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර තිබුණි.</td></tr>
<tr><td>16</td><td>රටවිරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනට ආහාරපාන ලබා ගැනීම
මේ සම්බන්ධයෙන් ගෙවීම් නිර්දේශ කිරීම අනුමත කිරීම හා සහතික කිරීම සිදුකල සියලු නිලධාරීන්ගේ දැනුවත්භාවය මත රජයට අයත් මුදල් හිතාමතාව අයතු සහගතව හෝ නීති විරෝධීව රජයට වංචාවක්, පාඩුවක් හා කුඨ ලේඛන</td><td>661,500</td><td>මූලික පරීක්ෂණයේ නිර්දේශ මත පදනම්ව, පහත නම් සඳහන් නිලධාරි 7 දෙනෙකු වෙත චෝදනා පත්‍ර නිකුත් කර ඇත.</td><td>විධිමත් විනය පරීක්ෂණ වාර්තාවට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් දඬුවම් පමුණුවා තිබුණු අතර ඉදිරි කටයුතු සඳහා මෙම සිද්ධිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර තිබුණි.
<table>
<tr><th>චෝදනාවට ලක්වූ නිලධාරියා</th><th>ගෙන ඇති විනය ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>ආර්.කේ.කේ.එම්.පී.රන්දෙණියමහතා</td><td rowspan="2">රු. 82,295/- ක මුදලක් සමාන වාරික 36 කින් මාසික වැටුපෙන් අය කිරීම හා වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීම</td></tr>
<tr><td>බී.ඩබ්.එන්.පී.කේ.ටී.හෙට්ටිආරච්චි මහතා</td></tr>
</table></td></tr>
</table>

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

23

	සකස් කිරීමක් සිදුවීම.			එම්.ඒ.පී. ප්‍රියදර්ශන මහතා එම්.එස්. ප්‍රියදර්ශනි මිය ඒ.එම්. රාජපක්ෂ මහතා	උක්ත පරිදි මාසික වැටුපෙන් අය කර ගැනීම හා වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීම.
				එච්.එන්.කේ. සිල්වා මහත්මිය	රු.250,000 ක මුදලක් සමාන වාරික 60 කින් මාසික වැටුපෙන් අය කර ගැනීම හා වැටුප් වර්ධක තුනක් විලම්භනය කිරීම
				ආර්.එම්.එම්.එච්.රණතුංග මහත්මිය	සියළු චෝදනා වලින් නිදොස් වී ඇත
				මාණ්ඩලික සහකාර එච්.එන්.කේ. සිල්වා මහත්මිය	ඇය වෙත නිකුත් කර ඇති විනය නියෝගයට එරෙහිව කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත.

(මෙම සටහන ජාතික විගණන කාර්යාලය විසින් 2022 දෙසැම්බර් 08 දින පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සදහා පමණක් පිළියෙල කරන ලද්දකි.)

24

ඇමුණුම 03

07. රජයට අයිති බදු මුදල් නිසි පරිදි අය වී නොතිබීම

පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නගන ලද ප්‍රශ්නය

කාර්යාංශ පනතේ 52(1) ප්‍රකාරව බලපත්‍රලාභියෙකු විසින් ලබාගත් සෑම කොමිස් මුදලකින්ම 5% ක සෙස් බද්දක් අයකර ගත යුතු බව සඳහන්ව තිබුණ ද විගමනය වන ගෘහ සේවිකාවන් සඳහා පමණක් ඔවුන්ට ලැබෙන කොමිස් මුදල නොසලකා රු. 100,000/- ක කොමිස් මුදලක් ලැබීම යන පදනම මත ඉන් 5% ක් වන රු.5000/- ක සෙස් බද්දක් අයකර ගැනීමට තීරණය කර තිබීම සහ එය රජයට අය විය යුතු නිවැරදි බදු මුදල නොවන බව.

පිළිතුර

ආරම්භයේ සිට 2014 වර්ෂය තෙක් විදේශ රැකියා ඒජන්සි වලට ලැබෙන කොමිස් මුදලින් 5% ක් අය කිරීම සිදුකිරීම කළ අතර එහිදී නිරීක්ෂණය වූයේ විදේශ රැකියා නියෝජිතයන් නිසි පරිදි ශ්‍රී ලංකාවේ රැකියා නියෝජිතයාට ගෙවන මුදල ව්‍යාපාරික ගිවිසුමේ අනාවරණය නොකරන බවයි. 2009 වර්ෂයේදී රුපියල් මිලියන 27ක්ද 2010 වර්ෂයේදී රුපියල් මිලියන 29ක්ද 2011 වර්ෂයේදී රුපියල් මිලියන 20ක්ද 2012 වර්ෂයේදී රුපියල් මිලියන 28ක්ද 2013 වර්ෂයේදී රුපියල් මිලියන 21ක්ද වශයෙන් සෙස් බදු කාර්යාංශයට ලැබී තිබුණි.

මෙහිදී පනත ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන මාසික වාර්තා වලද ලද කොමිස් මුදල් පිළිබඳව, සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමක්ද නොවීය.

මෙම කාරණා අධ්‍යයනය කිරීමෙන් පසු 2014 වර්ෂයේ සභාපති චක්‍රලේඛ 02/2014 යටතේ සෑම ගෘහ සේවිකාවක් බඳවා ගැනීමේදී කොමිස් මුදල වශයෙන් රුපියල් ලක්ෂයක් ලැබේ යැයි සළකා ඉන් 5%ක් වන රු. 5000/-ක් සෙස් මුදල වශයෙන් ගණනය කර මැදපෙරදිග කලාපය සඳහා විදේශගත වන සෑම ගෘහසේවිකාවක් වෙනුවෙන් අය කිරීමට තීරණය කරන ලද අතර, ගෘහස්ථ නොවන රැකියා සඳහා රු. 60,000/- ක් ලැබේ යැයි සලකා 5% ක් අය කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 වර්ෂයේදී රුපියල් මිලියන 292ක් ද 2015 වර්ෂයේදී රුපියල් මිලියන 255ක්ද 2016 වර්ෂයේදී රුපියල් මිලියන 202ක්ද 2017 වර්ෂයේදී රුපියල් මිලියන 158ක්ද 2018 වර්ෂයේදී රුපියල් මිලියන 194ක්ද 2019 වර්ෂයේදී රුපියල් මිලියන 198ක්ද අය වුණි. 2020 වර්ෂයේදී ශ්‍රමිකයන් විදේශගත වීම අඩු වූ බැවින් එය රුපියල් මිලියන 55 තෙක් අඩුවිය. 2021 වර්ෂයේදී නැවත වරක් කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව හෙළිදරව් කරන කොමිස් මුදලින් 5%ක් අය කිරීමට පටන්ගත් අතර, ලැබූ සෙස් මුදල රුපියල් මිලියන 317කි. තවද, 2022 වර්ෂයේ නොවැම්බර් මස 30 දිනට සෙස් වශයෙන් රුපියල් මිලියන 834 ක් කාර්යාංශ ආදායම ලෙස ගිණුම්ගත කර ඇත.

මේ අනුව මෙහිදී නිරීක්ෂණය වන්නේ 2014 වර්ෂයේදී 5%ක් වෙනුවට රු.5000/-ක් අය කිරීම හේතුවෙන් ඉතා විශාල ලෙස සෙස් ආදායම වැඩි වීමක් පෙන්නුම් කර ඇති බවය. එසේම 2021 වර්ෂයේදී නැවත වරක් ප්‍රකාශිත කොමිස් මුදලින් 5%ක් අය කිරීම ආරම්භ කිරීමේදී සෙස් මුදල ඉහළ යාමක් පෙන්නුම් කර ඇති බවය.

තවද, සෙස් බදු ගෙවන ශ්‍රමිකයන් ලියාපදිංචි වීම 2022 වර්ෂයේදී ඉහළම අගයක් වන 72,525 වීම ද වැඩි මුදලක් සෙස් වශයෙන් ලැබීමට හේතු විය. තවද, ඒක පුද්ගල සෙස් ආදායම ඇමරිකානු ඩොලර් වලින් බැලීමේදී 2021 වර්ෂයේදී ඉහළ යෑමක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වේ.

ඉහත 2021 සහ 2022 වර්ෂයන්හිදී සෙස් බදු ආදායමේ වර්ධනය සඳහා කොමිස් මුදල් ලැබෙන රැකියා කාණ්ඩ විදේශගත වීම වැඩි වීම සහ විනිමය අනුපාතයේ වෙනස් වීමද බලපා ඇති බව නිරීක්ෂණය වේ. මෙය පහත වගුව අධ්‍යයනය මඟින් තවදුරටත් පැහැදිලි වේ.

වර්ෂය	කොමිස් මුදල් ලද රැකියා ඇණවුම් හරහා ලියාපදිංචි වූ ශ්‍රමිකයින් ගණන	විනිමය අනුපාතය (වර්ෂ අවසාන) රුපියල් ඇ.ඩොලරයට	සෙස් බදු ආදායම රු. මිලියන	සෙස් බදු ආදායම ඇ.ඩො.මි.	එක් අයෙකු වෙනුවෙන් ලැබෙන කොමිස් මුදල මත වූ 5% සෙස් මුදල (ඇ.ඩො.)
2014	67,401	130.36	292	2.23	33
2015	64,383	141.94	255	1.79	27
2016	51,534	147.84	202	1.36	26
2017	41,358	150.91	158	1.04	25
2018	49,463	177.49	194	1.09	22
2019	49,624	179.66	198	1.10	22
2020	12,413	184.12	55	0.29	23
2021	27,168	198.50	317	1.59	58
2022 නොවැම්බර් මස 30 දින තෙක්	72,525	361.24	834	2.30	31

වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය/ (අලාභය) හෝ අතිරික්තය/ (ඌණතාවය)

ආයතනය	බදු පෙර ලාභය/ (අලාභය) (රු.)		
	2019	**2020**	**2021**
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	(1,049,650,220.00)	630,754,450.00	632,791,840.00